# සිංහල සමාජයේ පවතින කිරිඅම්මා දානය හා බැඳුණු සත්පත්තිනි සංකල්පය පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක්

විමලසිරි පුංචිහේවා

සිංහල අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

---

## සාර සංක්ෂේපය

සිංහල ජනයා අතීතයේ සිට ම කෘෂි කර්මාන්තයේ සශ්‍රීකත්වය සඳහාත්, තමා හෝ තම පවුල වෙත පැමිණෙන විවිධ අපල, උපද්‍රව, අතුරු ආන්තරා හා රෝගාබාධ ආදියෙන් මිදීම සඳහාත් විවිධ අභිචාර විධි අනුගමනය කළහ. මේ හා බැඳුණු වත්පිළිවෙත් හෙවත් පුද සිරිත් සමූහයක් සිංහල සමාජය ඇසුරෙහි අද ද දක්නට ලැබේ. පත්තිනි දේව විශ්වාසය නැතහොත් පත්තිනි පිදීම ප්‍රධාන කොට ගෙන කිරිඅම්මාවරුන්ගේ සහභාගිත්වයෙන් සිංහල සමාජය ඇසුරෙහි වර්තමානයෙහි ද පැවැත්වෙන කිරිඅම්මා දානය හෙවත් කිරිඅම්මලාගේ දානය ද එවැනි එක් අභිචාර විධියකි. මේ දානය පිළිගන්වන්නේ කිරිඅම්මාවරුන්ට වුව ද එහි දී පුද ලබන්නේ පත්තිනි දෙවඟන යි. එහෙයින් මෙය පත්තිනි පූජාවක් ලෙස හැඳින්විය හැකි ය. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ පත්තිනි සහ කිරිඅම්මාවරුන් යනු කවුරුන් ද ? පත්තිනි ඇදහිල්ලට කිරිඅම්මාවරු සම්බන්ධ වන්නේ කෙසේ ද? කිරිඅම්මා දානය නම් වූ මේ අභිචාර විධිය නැතහොත් ශාන්තිකර්මය සිංහල සමාජයට වැදගත් වන්නේ කුමන කරුණක් හේතු කොට ගෙන දැයි යන්න විමසා බැලීම යි. මේ පර්යේෂණය සඳහා ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක ක්‍රමවේදය අනුගමනය කරන ලදි. කිරිඅම්මාවරුන් හා පත්තිනි ඇදහිල්ල පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණවලින් කරන ලද අධ්‍යයන රාශියක් පැවතිය ද කිරිඅම්මා දානය සහ සත්පත්තිනි අන්තර් සම්බන්ධතාව පිළිබඳ ගැඹුරු පර්යේෂණයකට ලක් නොවීමේ රික්තය පූරණය කිරීම මෙම පර්යේෂණයෙහි විශේෂත්වය යි.

මෙහි දී ක්ෂේත්‍ර අධ්‍යයනයත්, පුස්තකාල අධ්‍යයනයත් යන අංශ දෙක ම භාවිත කෙරිණි. ක්ෂේත්‍රීය අධ්‍යයනයේ දී දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රමුඛ කොට ගත් අතර එහි දී මේ ශාන්තිකර්මය නිරීක්ෂණය කිරීමත්, එහි නිරත වන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමත් සිදු කරන ලදි. පුස්තකාලය අධ්‍යයනයේ දී ලංකාවේ විවිධ ප්‍රදේශවල මෙය සිදු කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. ඒ, ඒ පිළිබඳ ලියවී තිබූ ලිපිලේඛන ආශ්‍රයෙනි. ඒ අනුව අභිචාර විධි පිළිබඳවත්, පත්තිනි සහ කිරිඅම්මාවරුන් පිළිබඳවත්, කිරිඅම්මාවරුන් පත්තිනි ඇදහිල්ලට සම්බන්ධ වන්නේ කෙසේ ද? යන්නත් කිරිඅම්මා දානය සිංහල සමාජයට වැදගත් වන්නේ කුමන පරමාර්ථයක් ඉෂ්ට කර ගැනීමට ද යන්නත් විමසා බැලීමට හැකි විය. මේ පර්යේෂණය මඟින් සිංහල ජනයාගේ ඇදහිලි, විශ්වාස පද්ධතියත් ඒ හා බැඳුණු වත්පිළිවෙත්වල සමාජමය වටිනාකම් සහ එහි විද්‍යාත්මක පදනමත් හඳුනා ගැනිණි. එනම්, මේ අභිචාර විධිය හෙවත් ශාන්තිකර්මය පැවැත්වීම හේතු කොට ගෙන පවුල් ඒකකය තුළ සංහිඳියාවත්, සහනශීලි මිනිසුන් නිර්මාණය වීමෙන් සහනශීලි

සමාජයක් ගොඩනැගීමට මේ පුද සිරිත් හේතු වන ආකාරය අවබෝධ කර ගැනීමට සහ එය සමාජයේ යහපැවැත්මට හේතු වී ඇති ආකාරය තහවුරු කර ගැනීමටත් හැකි විය.

**ප්‍රමුඛ පද:** අභිචාර විධි, කිරිඅම්මා දානය, කිරිඅම්මාවරු, පත්තිනි පිදීම, වත්පිළිවෙත්

## An analytical study of the concept of Sathpaththini associated with Kiri Amma Danaya in Sinhala society

## Abstract

In the past, the Sinhalese people followed various rituals for the prosperity of the agricultural industry and to rid of multiple evils, dangers, side dangers, and diseases that befall themselves or their families. A group of rituals or religious customs associated with this are seen even today in Sinhala society. One such method of behavior is Kiriamma Daana, which is still practiced today in the Sinhala society with the participation of only the mothers, with the Paththini deva faith or Paththini offering as the main. Mainly the Goddess Pattini is worshipped in this event. Hence this can be called a Patthini Pooja. The research problem of this study is who are Paththini and Kiriamma? How is Kiriamma concerned with Paththini's faith? It is to inquire as to what is the reason why this practice called Kiriamma Danaya or ritual is important to the Sinhalese society. A qualitative methodology was followed for this research. The specialty of this research is to fill the gap of lack of in-depth research on the interrelationship of Kiriamma Danaya and Satpaththini faith the existence of many studies done from different perspectives on Kiriamma's and Paththini faith. This research is based on the field study and library surveys. In the field study, the Hambantota district of the Southern Province was prioritized, where this pacification was observed and interviews were conducted with the participants. The secondary sources were used to understand what are the rituals related to Goddess Pattini, Kiriamma danaya done in different parts of Sri Lanka previously and how do Kiriamma relate to the Paththini faith? It was also possible to inquire about what purpose Kiriamma Danaya is important for the Sinhala society. Through this research, the beliefs and belief systems of the Sinhalese people and the social values of the associated customs and their scientific basis were identified. In other words, due to the conduct of this ritual, it was possible to understand how these sacred customs lead to the formation of a peaceful society by creating harmony within the family unit and the creation of peaceful people and to confirm how it has led to the well-being of the society.

**Keywords:** Customs, Goddess Pattini, Kiriamma, Rituals

**ප්‍රවේශය**

ජනශ්‍රැතිය යනු ජන සමූහයක් අතර මුඛ පරම්පරාගත සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ සාමූහික දැන නුවණ හෙවත් ඥාන සම්භාරය යි. ප්‍රාථමික ජන සමාජයක මෙන් ම නූතන ජන සමාජයක වුව ද ජනශ්‍රැතිය දැක ගත හැකි ය. ජනශ්‍රැතිය ජනිත වන්නේ ජන ජීවිතය ඇසුරෙන් වන බැවින් ජනශ්‍රැතිය හුදෙක් ම ජන ජීවිතය හා බැඳී පවතී. ජනකවි, ජනකතා, ජන ගී, ජන ක්‍රීඩා, සිරිත් විරිත්, ඇදහිලි, විශ්වාස, අභිචාර ආදී වශයෙන් මෙහි ප්‍රභේද හෙවත් අංග රාශියක් දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීම මඟින් එම ජන සමාජය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගත හැකි ය.

මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධියේ සිට ම මිනිසා අදෘශ්‍යමාන බලවේග කෙරෙහි මහත් විශ්වාසයකින් යුක්ත ව ඒ හා බැඳුණු විවිධ පුද සිරිත් අනුගමනය කළේ ය. මානවයාගේ ආරම්භක අවධියේ පටන් ක්‍රමයෙන් විද්‍යාත්මක හා තාක්‍ෂණික වශයෙන් අතිමහත් දියුණුවක් ලබා සිටින වර්තමාන මිනිසා තුළ පවා එම විශ්වාසයන්හි එල්බ කටයුතු කරන ආකාරය හඳුනා ගත හැකි ය. අචේතනික වස්තූන් කෙරෙහි සචේතනික ගුණයක් ආරෝපණය කරමින් එම වස්තූන් දේවත්වයෙන් සලකා ඔවුන්ගෙන් පිහිට පතනු පිණිස විවිධ වූ වත්පිළිවෙත් අනුගමනය කිරීම මෙහි දක්නට ලැබෙන මූලික ලක්‍ෂණය යි. ඒ අනුව මානවයාගේ පරිණාමයත් සමඟ විවිධ මානව සමාජවල දී තම තමන්ට අභිමත දේව, යක්‍ෂ, භූතාදීන් කෙරෙහි ආරෝපණය කරමින් පුද පිළිවෙත් පැවැත්වීමට ඔවුන් පෙලඹී යන ආකාරය දක්නට ලැබේ. මෙවන් වූ විශ්වාස මත පදනම් වූ පුද සිරිත් අනුගමනය කිරීමට අතීත මෙන් ම වර්තමාන මිනිසා ද පෙලඹී ඇත්තේ එමඟින් ස්වකීය අභිමතාර්ථ සපුරා ගත හැකි ය යන දෘඪතර අපේක්‍ෂාව පෙරදැරි කර ගෙන ය. තමා වෙත එල්ල වන විවිධ අභියෝගවලට සාර්ථක ව මුහුණ දීමටත්, කායික හා මානසික පීඩනය දුරු කොට ශක්තිය හා ජයග්‍රහණය ළඟා කර ගැනීමටත් මෙමඟින් ලැබෙන පිටුබලය අතිමහත් බව ඔවුන්ගේ විශ්වාසය විය. එවන් විශ්වාස මත පදනම් වී අතීත මිනිසා මෙන් ම වර්තමාන මිනිසා විසින් ද පවත්වනු ලබන විවිධ ඇදහිලි හා බැඳුණු පුද සිරිත් හෙවත් වත් පිළිවෙත් පොදුවේ අභිචාර විධි නමින් අර්ථ දැක්විය හැකි ය.

වර්තමානයේ ද ගෘහාශ්‍රිත ව පැවැත්වෙන අභිචාර විධි අතර පත්තිනි දේවතාවිය හෙවත් පත්තිනි මෑණියන් ප්‍රධාන කොට ගෙන පවත්වනු ලබන කිරිඅම්මාවරුන්ගේ දානය ද සිංහල ජන සමාජයේ ප්‍රචලිත ශාන්තිකර්මයකි. තමා හා තම පවුල වෙත බලපා ඇති සියලු අපල

උපද්‍රව දුරු කොට කායික හා මානසික ශක්තිය ලබා ගැනීමත්, භවභෝග සරු වී සශ්‍රීකත්වය ළඟා කර ගැනීමත් මෙහි අරමුණ බවට පත් ව ඇත.

## අභිචාර විධි

ලෝකයේ ඉපැරණි බොහෝ මානව සමාජවල මිනිසා ස්වකීය අභිමතාර්ථ සාධනය සඳහා විවිධ අභිචාරකර්ම උපයෝගී කොට ගත්තේ ය. සොබා දහමේ විවිධ සංසිද්ධීන්ට මුහුණ දෙමින් අනාදිමත් කාලයක සිට විකාශනයට පත් ව සෑම අතින් ම වඩාත් පරිණත අවස්ථාවකට සේන්දු වී සිටින වර්තමාන මිනිසා තුළ පවා අභිචාර විධි පිළිබඳ ව පවතින්නේ අපමණ විශ්වාසයකි. එසේ ද වුව මානව සමාජය තුළ අභිචාර විධි ආරම්භ වූයේ කවදා දැයි නිශ්චය කිරීම බෙහෙවින් ම අසීරු කරුණකි. ඉපැරණි බොහෝ සංස්කෘති පිළිබඳ ව මානව විද්‍යාඥයින් විසින් මෙතෙක් සිදු කරන ලද පර්යේෂණ අනුව දැනට එළඹ ඇති පොදු නිගමනය නම් අභිචාර විධි මිනිස් ඉතිහාසය තරම් ම පෞරාණික බව ය. එනම්, සංස්කෘතික සමාජවල ආරම්භයටත් පෙර සිට ම අභිචාර විධිවල පහළ වීම සිදු වූ බව ය (මූර්ති, 1972: 13 - 15).

'අභිචාර' යන වචනයෙහි නිෂ්පත්තිය සිදු වී ඇත්තේ සිංහලයෙහි යෙදෙන 'අභි' යන සංස්කෘත තත්සම උපසර්ගයට 'චාර' යන පදය (අභි + චාර) එක් වීමෙනි. මේ සඳහා අර්ථ රාශියක් විවිධ ශබ්දකෝෂවල දක්වා තිබේ. මෙහි දී 'අභි' යනු වෙත හෝ කෙරෙහි යන අර්ථයත්, 'චාර' යනු හැසිරීම හෝ ගුප්ත ව හැසිරීම යන අර්ථයත් ගත හැකි ය. 'විධි' යනු ක්‍රමය හෝ පිළිවෙළ යි (සෝරත හිමි, බු.ව.2507: I , 2513: II, විජයතුංග, 1982: I, 1984: II).

ඒ අනුව අභිචාර විධි යනු මිනිසා කෙරෙහි නැඹුරු වූ ගුප්ත හැසිරීම පහදවා ගන්නා පිළිවෙළ යි. නැතහොත් මිනිසාගේ අභිලාෂ මුදුන්පත් කර ගැනීම සඳහා ඔවුන් කෙරෙහි නැඹුරු වූ ගුප්ත හැසිරීම යොදා ගන්නා ආකාරය යි.

අභිචාර විධි යනු කුමක් ද ? යන්න පිළිබඳ අදහස් දක්වන ප්‍රකට මානව විද්‍යාඥයකු වූ බ්‍රොනිස්ලෝ මැලිනොවුස්කි (Bronislow Malinowski) සඳහන් කරන්නේ "අභිචාර විධි වනාහි යම් තැනැත්තෙකු තමා දන්නා කාර්මික දැනීම හා උපක්‍රමවලින් ඉටු කර ගත නොහැකි කාර්ය ඉටු කර ගැනීම සඳහා දරන ප්‍රයත්නයක් බව යි (හෙට්ටිආරච්චි, 1963: 598).

"යම් කිසි අභිමතාර්ථයක් ඉටු කර ගැනීම සඳහා කරන ඉණා, විත, හූනියම් යනාදිය අභිචාර විධි නමින් හැඳින්විය හැකි බවත්, මේ හැම ක්‍රියාවක් ම මන්ත්‍ර ගුරුකම් (Exorcism) යන

වචනයෙන් ද දැක්විය හැකි බවත්, මෙවැනි ක්‍රියා ලෝකයේ සෑම මනුෂ්‍ය ජාතියක් අතර ම දක්නට ලැබෙන බවත් අභිචාර විධි පිළිබඳ අදහස් දක්වන ජේම්ස් ජෝර්ජ් ෆ්‍රේසර් (Jams George Frazer) සඳහන් කරයි" (හෙට්ටිආරච්චි, 1963: 598).

මේ අනුව මානව විද්‍යාඥයින්ගේ සහ ශබ්දකෝෂකරුවන්ගේ අදහස් ද, අභිචාර විධි යන ක්‍රියාවලිය පිළිබඳ ව ද විමසා බැලීමේ දී පෙනීයන්නේ 'මිනිසා තම අභිමතාර්ථ සඵල කර ගැනීම සඳහා අතිමානුෂික බලවේග හෙවත් අදෘශ්‍යමාන බලවේග පහදවා ගනු පිණිස අනුගමනය කරන ක්‍රියා මාර්ගය' අභිචාර විධි යනුවෙන් හැඳින්විය හැකි බව යි.

ඒ අනුව අභිචාර විධි යනු මිනිසා අදෘශ්‍යමාන බලවේග කෙරෙහි තබන ලද විශ්වාසයෙන් යුතු ව එම බලවේග පහදවා ගනු පිණිස අනුගමනය කරනු ලබන වත් පිළිවෙත් හෙවත් පුද සිරිත් (Rite / Ritual) විශේෂයක් බව පැහැදිලි වෙයි.

ප්‍රකෘති ලෝකය හෙවත් ස්වභාවධර්මයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ යථාර්ථය අවබෝධ කර ගැනීමට අසමත් වූ අතීත මිනිසා (Primitive Man) එම ක්‍රියා කිසියම් නොපෙනෙන බලවේගයක ප්‍රතිඵල යැයි කල්පනා කළේ ය. එනම්, විශ්වය තුළ දක්නට ලැබෙන ස්වාභාවික වස්තූන් සහ ස්වාභාවික ක්‍රියාවලීන් හෙවත් ධර්මතාවන් ඔහු දුටුවේ දෙවිවරුන් සහ ඔවුන්ගේ ශක්තීන් හෝ ක්‍රියාවලීන් ලෙස ය.

ඉර, හඳ මෙන් ම අහස, පොළොව, වර්ෂාව ආදිය ද ඔහුට පෙනුණේ දෙවිවරුන් ලෙසිනි. උෂ්ණය, ආලෝකය, විදුලි, අකුණු ආදිය එම දෙවිවරුන්ගේ ක්‍රියාවන් ය. අකල් වැසි, ඉඩෝර, ගංවතුර, දුර්භික්ෂ හා වසංගත රෝග වැනි අනර්ථදායී සිදුවීම් ඇති වන්නේ එම දෙවිවරුන් කෝපයට පත් වීමෙනි (සරච්චන්ද්‍ර, 1992: 06).

එහෙයින් ස්වභාවධර්මය හෙවත් මේ අතිමානුෂික බලවේග මඟින් ස්වකීය ජීවිතයට එල්ල වන විවිධ උපද්‍රව මැඩ පවත්වා ජයග්‍රහණය ලබා ගැනීමට නම් එම බලවේග සතුටු කළ යුතු බව ඔහුගේ විශ්වාසය විය. ඒ අනුව එම අදෘශ්‍යමාන බලවේගවලට හෙවත් සොබාදහමට දේවත්වයක් ආරෝපණය කළ ප්‍රාථමික මනුෂ්‍යයා ඒවායෙහි පිහිට පතනුවස් එම දෙවිවරුන්ට වැඳුම් පිදුම් කිරීමටත්, පුද පූජා පැවැත්වීමටත්, කන්නලව් කිරීමටත්, පෙලඹී ගියේ ඒ මඟින් ස්වකීය ජීවිතයට ශුභසිද්ධිය ළඟා කර ගැනීමේ අපේක්ෂාව පෙරදැරි කර ගෙන ය.

ආදි කාලීන මානවයාගේ මේ අදෘශ්‍යමාන බලවේග අතරට දෙවිදේවතාවුන් පමණක් නො ව යක්ෂ, භූතාදීහු ද එක් ව සිටියහ. එයට හේතු වූයේ අදෘශ්‍යමාන භූත ලෝකයක් පිළිබඳ ව ද ඔහු තුළ විශ්වාසයක් පැවතීම යි. තමා අවට ඇති ගස්, ගල්, කඳු, පර්වත, වැව්, පොකුණු, වනළැහැබ් ආදියට දෙවි දේවතාවුන් ද, යක්ෂ, භූතාදීන් ද අධිගෘහිත ව ඇතැයි ඔහු සිතී ය.

එසේ ම මිය ගිය ප්‍රාණීන් උඩු ගුවනේත්, පොළෝ තලයේත්, අන්තරීක්ෂයේත් නිරතුරු ව සැරිසරමින් භූතාත්ම ලෙසින් පෙනී සිට මිනිසුන්ට විවිධ උපද්‍රව පමුණුවන බව ඔහුගේ විශ්වාසය විය (සරච්චන්ද්‍ර, 1992: 06 - 10).

ඒ අනුව අචේතනික වූ ප්‍රකෘති වස්තූන් සහ එහි ක්‍රියාකාරීත්වය හෙවත් සොබාදහම විෂයෙහි සචේතනික ගුණයක් හෙවත් දේවත්වයක් ආරෝපණය කරමින්, එම දෙවි දේවතාවුන්ට සහ යක්ෂ, භූතාදීන්ට පුද පූජා තබා වත් පිළිවෙත් පැවැත්වීමෙන් ද, කන්නලව් කිරීමෙන් ද ඔවුන් සතුටට පත් කොට ඔවුන්ගේ ප්‍රසාදය දිනා, සොබාදහම තමා හා තම පරිසරය කෙරෙහි යහපත් සේ නැඹුරු කරවා ගැනීම මඟින් ස්වකීය අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම ඔහුගේ අපේක්ෂාව විය.

අභිචාර විධි ලොව පහළ වූයේ එම දෙවි දේවතාවුන් සහ යක්ෂ, භූතාදීන් විෂයෙහි සිදු කළ මේ පුද පූජා, කන්නලව්, දොළ බිලි හා නැටුම් ගැයුම් ඇසුරු කොට ගෙන ය. ලක්වැසි ජනයා ද මෙවැනි ජගත් ඇදහිලි හා විශ්වාසවලින් යුක්ත ව කටයුතු කළ ආකාරය සිංහල ජන සමාජය තුළ දක්නට ලැබෙන විවිධ දෙවි දේවතාවුන් සහ යක්ෂ භූතාදීන් විෂයෙහි පවත්වනු ලබන අභිචාර විධි ආශ්‍රයෙන් අවබෝධ කොට ගත හැකි ය.

පත්තිනි පිදීම මුල් කර ගෙන කිරිඅම්මාවරුන්ගේ සහභාගිත්වයෙන් සිංහල සමාජය තුළ පැවැත්වෙන කිරිඅම්මා දානය ද තමා සහ තම පවුල වෙත බලපාන ඇස්වහ, කටවහ, හෝවහ ආදී දෝෂාන්ධකාරයන් දුරු කර ගැනීම සඳහාත්, යක්ෂ, භූත, ප්‍රේත ආදීන්ගෙන් සිදු වන උපද්‍රව වළක්වා ගැනීම සඳහාත්, කරන කියන සියලු කටයුතු සාර්ථක වීම සඳහාත්, ගහ කොළ, භවභෝග සරුසාර වී සෞභාග්‍යය ළඟා කර ගැනීම සඳහාත් පත්තිනි මෑණියන්ගේ පිහිට, ආරක්ෂාව ලබා ගැනීමේ පරමාර්ථයෙන් සිදු කරනු ලබන තවත් එවැනි අභිචාර විධියකි.

## පත්තිනි දේවතාවිය.

සිංහල ගැමි බෞද්ධයාගේ ඇදහීමට පාත්‍ර වන දෙවිවරු විශාල සංඛ්‍යාවක් සිටිති. මේ අතර හින්දු දේව මණ්ඩලයට අයත් දෙවිවරුන් රාශියකි. බ්‍රහ්මයා, ශක්‍රයා, සතරවරම් දෙවිවරු, විෂ්ණු, ඊශ්වර, ස්කන්ධකුමාර, ගණේෂ, පත්තිනි ආදීහු ඒ අතර ප්‍රධාන වෙති. මොවුහු හින්දු දේව මණ්ඩලයට අයත් වුව ද පසුව බුදුදහම හා සම්බන්ධ වූ අය වූහ. බ්‍රහ්මයා සහ ශක්‍රයා (ඉන්ද්‍ර) බුදුන්වහන්සේ හා සම්බන්ධ ව කටයුතු කළ දෙදෙනෙකි. බුදු සසුන ආරක්ෂා කර ගැනීමේ කාර්ය පවරා තිබෙන්නේ විෂ්ණුට ය. එහෙයින් බෞද්ධ සාහිත්‍යයේ මේ දෙවියන් පිළිබඳ නිරන්තරයෙන් සඳහන් වෙයි. මෙසේ හින්දු දෙවිවරුන් බුදු දහම හා සම්බන්ධ වීම ලක්දිවට බුදුදහම පැමිණීමට පෙර භාරතයේ දී ම සිදු වූවක් බව ඇතැම් විද්වතුන්ගේ මතය

යි. මෙය ගිහියාගේ ජීවිතයට ගැමි ආගමෙන් ඉටු වූ කාර්යය ස්වල්ප වශයෙන් හෝ ඉටු කිරීමට බුද්ධාගම විසින් දරන ලද සියුම් ප්‍රයත්නයක් යැයි ද සිතිය හැකි ය (සරච්චන්ද්‍ර, 1992: 19).

එමෙන් ම සමන්, විභීෂණ, උපුල්වන්, නාථ, මහසෙන් ආදී දෙවිවරු මෙරට දී දේවත්වයට පත් වූ අය වෙති. විභීෂණගේ සම්බන්ධයක් නැතත් අනෙක් දෙවිවරු බුදුන්වහන්සේට උපකාර කළ, උන්වහන්සේ ඇසුරු කළ අය වූහ.

එසේ ම සමාජයේ ප්‍රභූත්වය ලබමින් මිනිසාට යහපත ළඟා කර දීම සඳහා කටයුතු කළ ප්‍රබල පුද්ගලයින් මිය ගිය පසු දේවත්වයට පත්වීම සිංහල සමාජයේ දක්නට ලැබෙන තවත් ලක්‍ෂණයකි. එවැනි ඇතැම් පුද්ගලයෝ භාරතයේ සිට මෙරටට පැමිණ පදිංචි වූ අය වෙති. තවත් සමහරු මෙරට වැසියෝ ම වූහ. මංගර, දෙවොල්, අයියනායක, මහසෙන් යන දෙවිවරු මේ ගණයට අයත් වෙති.

සිංහල ශාන්තිකර්ම විෂයෙහි පුද ලබන දෙවිවරු ඉහත සඳහන් කළ කුමන ආකාරයකින් හෝ ප්‍රභවය ලැබූ අය වෙති. ඔවුන්ගෙන් ඇතැමෙකු මුළු දිවයිනේ ම පුද ලබන අතර තවත් පිරිසක් ප්‍රදේශීය ව පුද ලබති. මෙහි සඳහන් කරන පත්තිනි දේවතාවිය භාරතීය හින්දු දේව මණ්ඩලයට අයත් වුව ද බුදු දහම හා සම්බන්ධ වී මුළු දිවයිනේ ම පුද ලබන ආකාරය දක්නට ලැබේ.

නිසි කලට අව්වැසි ලැබී භවභෝග සශ්‍රීක වීම අතීත මිනිසා විශ්වාස කළේ දේවාශිර්වාදයක් ලෙසිනි. ඒ සඳහා සශ්‍රීකත්වයට අධිපති දේවි දේවතාවුන්ට පුද පූජා තබා කන්නලව් කොට ඔවුන්ගේ ආශිර්වාදය ලබාගත යුතු විය. එසේ නොවුවහොත් ඔවුන්ගේ උදහසට ලක් වී සාගත, වසංගත, නියඟ හා ගංවතුර ආදි අනිටු පලවිපාකවලට මුහුණ දීමට සිදු වේ. මෙවැනි විශ්වාසවලින් යුතු ව සිංහල බෞද්ධ ගැමියා කටයුතු කළ ආකාරය ඔවුන් විසින් අතීතයේ සිට පවත්වාගෙන එන ලද විවිධ අභිචාර කටයුතුවලින් අනාවරණය වෙයි.

මේ සියලු සාගත වසංගත ආදි උවදුරු දුරලීමේ බලයක් පත්තිනි දෙවඟන සතු බවත්, සශ්‍රීකත්වය පිළිබඳ විශේෂ බලයක් ඇය සතු ව පවතින බවත් සිංහල ගැමියා විසින් විශ්වාස කරන ලද්දේ අතීතයේ සිට ය. එහෙයින් ඇය සතුටු කරනුවස් විවිධ පුද පූජා හා වත් පිළිවෙත් ආදියෙන් පිදීමට සිංහල ගැමියා නිරතුරු උත්සුක විය.

ලක්දිව සිංහල බෞද්ධ ජනයා වෙතින් පුද ලබන භාරතීය ප්‍රභවයක් ඇති එක ම දෙවඟන පත්තිනි දේවිය යි. හින්දු සම්ප්‍රදායට අනුව පත්තිනි ශිව දෙවියන්ගේ භාර්යාව වන පාර්වතියගේ අවතාරයකි. එහෙත් සිංහල සම්ප්‍රදායට අනුව ඇය මතු බුදු බව අපේක්‍ෂාවෙන්

පාරමිතා පුරන්නියකි (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 284). එහෙයින් සිංහල ජනවේදයට අයත් දේව සංකල්ප අතුරෙන් පත්තිනි ඇදහීම ප්‍රමුඛස්ථානයක් ගනියි. පතිව්‍රතා ධර්මයෙහි බලයෙන් විවිධ හාස්කම් දක්වී යැයි කියවෙන පත්තිනිය ලක්දිව සිංහල බෞද්ධ ජනයාගේ සශ්‍රීකත්වයේ දෙවඟන හැටියට ද සැලකෙයි.

සාගත, වසංගත, නියඟ හා ගංවතුර ආදී ස්වාභාවික අපල උපද්‍රවවලින් සහනය ලබා ගැනීමට ද, භවභෝග සරු වී සශ්‍රීකත්වය ළඟා කර ගැනීමට ද සිංහල ගැමි ජනයා විසින් පත්තිනි දෙවඟන විෂයෙහි පුද පූජා හා වත් පිළිවෙත් පවත්වනු ලබන ආකාරය අද ද දැකගත හැකි ය. මේ ශාන්තිකර්ම අතර කොහොඹායක් කංකාරිය, අංකෙළි පූජාව, පොල් කෙළිය, ගම්මඩු, දෙවොල් මඩු, පූනා මඩු, පහන් මඩු, ගී මඩු, කිරි මඩු, හැල්ලුම් මඩු හා කිරිඅම්මාවරුන්ගේ දානය ආදී ශාන්තිකර්ම ප්‍රධාන ගණයේ ලා සැලකිය හැකි ය.

ලක්දිව පත්තිනි ඇදහීම ගජබා රජුගේ රාජ්‍ය කාලය (ක්‍රි. ව. 114 – 136) දක්වා ඈතට දිවෙයි. ගජබා රජු තම දකුණු ඉන්දීය ආක්‍රමණයේ දී පත්තිනි දේවියගේ සලඹ ලක්දිවට ගෙන ආ බව රාජාවලියෙහි සඳහන් වේ (සූරවීර, 1976: 187, 188). ඉන්දියාවේ ‘සෙන්ගුට්ටුවාන්’ නම් සොළී රජු පත්තිනි දෙවොල පිහිටවූ අවස්ථාවේ දී ලංකාවේ ‘කයවාගු’ (කයබාහු හෙවත් ගජබාහු) (ජයවර්ධන, 1985: 133, 134) රජු ද එම උත්සවයට සහභාගී වූ බව ‘සීලප්පදිකාරම්’ නම් දක්ෂිණ භාරතීය මහා කාව්‍ය ග්‍රන්ථයෙහි දැක්වේ. මේ ග්‍රන්ථය සඳහා පසුව ලියන ලද සන්නවල ද ‘කයවාගු’ විසින් පත්තිනි පූජාව ලක්දිවට හඳුන්වා දෙන ලද බව සඳහන් වෙයි (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 284). ඒ අනුව දක්ෂිණ භාරතයේ පැතිර තිබූ පත්තිනි ඇදහිල්ල ලක්දිවට ගෙන එන ලද්දේ ගජබා රජු විසිනැයි කියවේ.

පළමුවෙන් ම පත්තිනිය පිළිබඳ කියවෙන කතා පුවත දැක්වෙන්නේ දක්ෂිණ භාරතීය සංගම් යුගයට අයත් වීර කාව්‍යයක් ලෙස සැලකෙන ඉලංගෝ අඩිගල් නමැති කවියා විසින් රචිත ‘සීලප්පදිකාරම්’ නමැති ග්‍රන්ථයෙහි ය. මෙහි දැක්වෙන කතා පුවතට අනුව වෙළෙඳ කුලයේ උපන් ‘කන්නගි’ නම් කාන්තාව ළාබාල වියේ දී ම සම කුල ‘කෝවලන්’ සමඟ විවාහ වෙයි. පසුව මාධවී නම් වෙසඟනක හා මිත්‍ර ව විසූ කෝවලන් දිළින්දෙකු වී නැවත කන්නගිය වෙත එයි. වෙළෙඳාම පිණිස මූල ධනය සොයා ගන්නට කන්නගියගේ පා සලඹක් විකිණීම සඳහා මධුරාපුරයට ගිය කෝවලන් එහි රජ බිසවගේ සලඹක් සොරා ගත්තේ යැයි චෝදනා ලැබ මරණයට පත් කරනු ලබයි. මේ සිදු වූ අසාධාරණය ගැන කන්නගිය කළ ශාපයෙන් රජ ද, බිසව ද මිය යති. කන්නගිය වම් පයෝධරය සිඳ නගරයට විසි කරන්නී ය. එයින් විහාරාරාම, ළමයින්, භික්ෂූන් හැර මුළු නගරය ම ගිනිබත් වේ (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 285).

ලක්දිව පත්තිනි ඇදහිල්ලෙහි 'සත් පත්තිනි' සම්ප්‍රදායක් මෙන් ම 'දොළොස් පත්තිනි' සම්ප්‍රදායක් ද දක්නට ලැබේ. මේවා 'සීලප්පදිකාරම්' හා 'මණිමේඛලෛ' යන ග්‍රන්ථවලින් ගත් ඒවා යැයි සිතිය හැකි ය (කාරියවසම්, 1990: 80). එසේ ද වුව සත්පත්තිනි සහ දොළොස්පත්තිනි සංකල්පය (සම්ප්‍රදාය) දක්නට ලැබෙන්නේ දක්ෂිණ භාරතයේ නො ව සිංහල සමාජය ඇසුරෙහි ය.

පත්තිනි දෙවඟන කෙරෙහි දැඩි භක්තියක් දක්වන සිංහල බෞද්ධ ජනයා සත් පත්තිනියකට වැඳුම් පිදුම් කරති. පුද පූජා තබති. කන්නලව් කරති. ඒ උරමාල පත්තිනි, කරමාල පත්තිනි, ලේ පත්තිනි, මල් පත්තිනි, ගිනි පත්තිනි, වීර පත්තිනි හා සිද්ධ පත්තිනි යනුවෙනි (ආරියරත්න, 1991: 85-127). එය ඇතැම් තැනක මෙසේ ද දක්නට ලැබේ. ගිනි පත්තිනි, ජල පත්තිනි, ඔරුමාල පත්තිනි, තෙද පත්තිනි, මල් පත්තිනි, සිරිමාමුනි පත්තිනි හා අඹ පත්තිනි යන්නෙනි. මේ සත් පත්තිනි මෑණිවරුන් පත්තිනි දෙවියන්ගේ අවතාර හැටියට ද සඳහන් වේ (පියතිලක හල්පෙ, 2019: 12, 13).

සත් පත්තිනි උපත ජලෙන්, දලෙන්, මලෙන්, ගලෙන්, කුළෙන්, සළුවෙන් හා අඹයෙන් සිදු වූ බව පත්තිනි ශාන්තිකර්ම සාහිත්‍යයෙහි විස්තර වේ. 'සතර වරම් මල් යහන් කවි' නමැති කොල්මුර කව්වල සත් පත්තිනි උපත මෙසේ දැක්වේ.

| | |
|---|---|
| ජලෙනි දලෙනි මලෙනි සුරඹ පතිනි | උපන්නා |
| ගලෙනි කුළෙනි සළුවෙනි එක් වරක් | උපන්නා |
| එවෙනි සවෙනි සත්වෙනිවර අඹෙන් | උපන්නා |
| මෙවැනි  පතිනි තෙදිනි මෙලක්දිව | බබළන්නා |

(සුමනපාල සමරසේකර, 1995: 14).

ජනප්‍රවාදවල පත්තිනියගේ දොළොස් උපතක් කියවේ. ඒ 'දෙමට මලෙන්, ගිනි කඳෙන්, නයි කඳුළෙන්, විදුලියෙන්, පිනි බිඳුවෙන්, සිඟා රැලෙන්, මවිත අඹෙන්, සළු පොටෙන්, නුග පත්‍රයෙන්, කදුරු පොත්තෙන්, හෙණයෙන් හා ජලයෙන්' යනුවෙනි (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 284).

'කන්නගි' නම් දිළිඳු කාන්තාව තම සැමියා වූ 'කෝවලන්' සලඹ සොරෙකැයි නිරපරාදයේ මැරවීම පිළිබඳ පඬි රජුටත් රටටත් සාප කොට මිය ගියා ය. ඕ සිය පතිව්‍රතා බලයෙන් පඬිපුරය ගිනි ලූ බව කියවේ. පසුව ඇ පතිව්‍රතා බලය හේතු කොට ගෙන ම දේවත්වයට පත් ව පත්තිනි දෙවඟන නමින් ප්‍රකට වූවා ය (ජයවර්ධන, 1985: 133).

දෙයියන්ගේ ලෙඩ හෙවත් අම්මාවරුන්ගේ ලෙඩ (සරම්ප, පැපොල, වසූරිය) වළක්වා ගැනීම හෝ නිවාරණය සඳහා පත්තිනි දෙවියන්ගේ ආරක්ෂාව පැතිය යුතු බව සිංහල ජනයා තුළ මහත් විශ්වාසයක් පවතී (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 290).

සශ්‍රීකත්වය හා පතිව්‍රතා ධර්මය සංකේතවත් වන මේ දේවතාවිය වෙනුවෙන් දිවයින පුරා පුද පූජා පවත්වන ආකාරය එදා මෙන් ම අද ද දැක ගත හැකි වේ. මේ දෙවඟන උදෙසා වූ ප්‍රධාන දේවාලය නවගමුවේ පිහිටා ඇත (ඒකනායක මැණිකේ, 1997: 45).

## කිරිඅම්මාවරුන් සහ සත්පත්තිනි සංකල්පය.

සිංහල බෞද්ධයන් පුද පූජා පවත්වන භාරතීය ප්‍රභවයක් ඇති දෙවිවරුන්ගෙන් පත්තිනි දේවියට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. සිංහල සහ දෙමළ භාෂාවල භාවිත වන ‘පත්තිනි’ යන වචනය සංස්කෘත භාෂාවේ එන ‘පත්නී’ යන්නට අනුරූප ව නිපැදී ඇති බව සිතිය හැකි ය. එහි අර්ථය වන්නේ ‘පති භක්තියෙන් යුත් බිරිඳ’ යන්න යි. ඒ අනුව පත්තිනි යන්නෙහි 'පති භක්තිය ඇත්ති' යන අර්ථය ගම්‍ය වේ (සුමනපාල සමරසේකර, 1995: 13, 14). දිවයිනේ සෑම ප්‍රදේශයක ම පාහේ මහත් භක්තියකින් පිදුම් ලබන පත්තිනියගේ උපත හා ජීවිත කතාව විවිධ මූලාශ්‍රයවල විවිධාකාරයෙන් දැක්වෙතත් එකී සෑම මූලාශ්‍රයක ම කියවෙන පුවත එක හා සමාන ය.

පතිව්‍රතා බලයෙන් නොයෙක් හාස්කම් දැක්වී යැයි කියවෙන දක්ෂිණ භාරතයේ ‘කන්නගි’ නම් කාන්තාව මරණින් පසු ඇයගේ පවිත්‍රතා බලයෙන් පත්තිනි නමින් දේවත්වයට පත් ව ඇත. දක්ෂිණ භාරතයේ පත්තිනි ලෙසින් එක් දේවතාවියක ඇදහූ අතර ලංකාවාසී ජනතාව එම දේවතාවිය සත් පත්තිනි හෝ දොළොස් පත්තිනි යන නාමයන්ගෙන් ආමන්ත්‍රණය කරන්නට වූහ. එයට හේතුව වී ඇත්තේ ඇයගේ උත්පත්තිය විවිධාකාරයෙන් සිදු වී ඇති බවට සිංහල ජනයා තුළ පවතින විශ්වාසය යි. සිංහල ජන සමාජයේ දැක්වෙන ආකාරයට ඇය සශ්‍රීකත්වයේ දෙවඟන ලෙස ගැමියෝ සැලකූහ. පත්තිනියගේ උත්පත්ති සියල්ල ම ස්වාභාවික වස්තූන්ගෙන් සිදු වී තිබීම එයට හේතු වී ඇත.

පත්තිනි දේවියගේ උත්පත්තිය සත් ආකාරයකින් සිදු වී ඇති බව සිංහල ජනතාවගේ පිළිගැනීම යි. සිංහල සමාජය තුළ අතිශයින් ජනප්‍රිය කිරිඅම්මා පිදීමේ පූජා විධිය මඟින් එය මැනවින් පැහැදිලි වෙයි. අප රටේ ගැමි ජනතාව වෙතින් පිදුම් ලබන කිරිඅම්මාවරුන් සත්දෙනා පත්තිනි දෙවියන්ගේ නියෝජිතයින් ලෙස හඳුන්වනු ලැබේ.

කිරිඅම්මාවරු සහ සත්පත්තිනි සංකල්පය පිළිබඳ විමසා බැලීමේ දී පෙනී යන්නේ ගජබා රජු විසින් ලංකාවට ගෙන එන ලද යි සැලකෙන පත්තිනි ඇදහිල්ල ලක්දිව ප්‍රචලිත ව

ඇත්තේ අතීතයේ සිට ලක්දිව පැවති ඇදහිල්ලක් වූ කිරිඅම්මා පිදීම හා සංකලනය වීමෙන් බව යි. සත් පත්තිනි සේ ම කිරිඅම්මා ඇදහිල්ලේ ද කිරිඅම්මාවරුන් සත් දෙනෙකු පිළිබඳ ව කියවෙයි. එමෙන් ම මේ කිරිඅම්මාවරුන් සත් දෙනාගෙන් නිරූපණය වන්නේ ලක්දිව ශාන්තිකර්ම අතර පවතින රටයැකුම හෙවත් රිද්දි යාගයේ එන වඳ බිසවුන් සත්දෙනා හෙවත් රිද්දි බිසවුන් සත්දෙනා බව ද පෙනී යයි. දනුදු හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලවේ නිම්නයේ පැවැත්වෙන කිරිඅම්මාවරුන්ගෙ දානයේ දී ගැයෙන කවිවලින් වැඩි අවස්ථා ගණනෙක සඳහන් වන්නේ පත්තිනි ගැන නො ව රිද්දි බිසවුන් පිළිබඳ ව ය. මෙහි දී දරුගැබ රැක දෙන්නටත්, දරුවන් රැක දෙන්නටත්, මව අරක්ෂා කර දෙන්නටත් ඉල්ලා සිටිනු ලබන්නේ රිද්දි බිසවුන්ගෙනි (රත්නපාල, 1995: 145). මේ කිරිඅම්මා-රිද්දි බිසවු සම්බන්ධය කිරිඅම්මා පිදීමේ දී ගායනා කරන මංගල සිරසපාද කවිවලින් ද විද්‍යමාන වෙයි.

ඉද්ද රොද්ද ගෙන උඩු ගුවනේ කෙළිති
බද්ද කර ලොවේ පුද පඬුරුත් ලබති
සිද්ද පතිනි දෙවි අණ මුදුනෙන් දරති
රිද්දි බිසෝවරු කළ ලෙඩ හරින් නිති

(කෝට්ටගොඩ, 1997 : 276).

ඇතැම් අවස්ථාවල කිරිඅම්මාවරු උඩයකුන් ලෙස ද හැඳින්වෙති. කිරිඅම්මා දානයේ දී ගායනා කෙරෙන කිරිඅම්මා උපත් කවිවලින් සහ කිරිඅම්මා කන්නලව්වලින් ද එය පෙන්නුම් කෙරෙයි.

ඇවිදින් ගංතෙර බැසපුව යක්කු
මා නැකතින් ඉස්නානෙට එක්කු
සමහරු සමයම් කෙළ කෙළ එක්කු
සමයං කෙළියට එයි උඩයක්කු

(කෝට්ටගොඩ, 1997: 275 ).

".... උතුම් වූ අම්මාවරු හත්දෙනා වහන්ස! ඔබ වහන්සේලා දශ දිශාන්තයෙහි පැතිරගිය උඩයක්කු යන නමින් බලයට පත් සෘදි යකුන් සත්දෙනා වහන්සේලාගේ කරුණාහරිත යෞවන රූපශ්‍රීයෙන් අතිසමෘද්ධ ව බිසෝවරුන් ව සිට සිංහල ද්වීපයට ගොඩබසිමියි සිතා ස්වාමිවර ලැබ විල්ලෝඩි දේශයේ සිට මේ සිංහල ද්වීපයට ගොඩබැස... " (කෝට්ටගොඩ, 1997: 39).

මින් පෙනී යන්නේ කිරිඅම්මාවරුන් උඩයක්කු නමින් ද හැඳින්වෙන බව යි. මෙසේ වී ඇත්තේ රිද්දි බිසවුන් සහ උඩයකුන් අතර පවතින සම්බන්ධය යි. එනම්, රිද්දි බිසවුන් සත්දෙනා යනු විල්ලෝඩි දේශයේ සිටි සෘදි හෙවත් සිද්දි යකුන් සත්දෙනාගේ භාර්යාවන්

වන මුදුන්මාල, ධර්මපාල, කොණ්ඩමාල, රනකපාල, ඕංකාර, ගිරිමේබල සහ එර්දි යන බිසෝවරුන් සත්දෙනා වීම යි.
ලංකාවේ කිරිඅම්මා සංකල්පය ප්‍රථමයෙන් පොදු ජන ව්‍යවහාරයට පැමිණ ඇත්තේ ආදිවාසී වැදි ජනයාගේ ඇදහිලිවල ආභාසයෙනි. වැදි ජනයාගේ ඇදහිලි, විශ්වාස ඔවුන් වෙසෙන පළාත්වල සිංහල ජනයා අතර ද ව්‍යාප්ත වී ඇති බවක් දක්නට ලැබේ. ඌව, බින්තැන්න, තමන්කඩුව, නුවර කලාවිය ආදි ප්‍රදේශවල දක්නට ලැබෙන කිරිඅම්මා නමින් හැඳින්වෙන දේව විශ්වාසය මඟින් ඒ බව තහවුරු වේ. නෑයකුන් පිදීම, වැදි ජනතාවගේ ප්‍රධාන ඇදහිල්ලකි. ඒ ඔවුන්ගේ මියගිය ඥාතීන් ය. කිරිඅම්මලා යනු එම නෑයකුන්ට අයත් කාන්තා දෙවිවරුන් ලෙස සැලකේ. ඒ අනුව කිරිඅම්මලා පිදීම ඔවුන්ට ම ආවේණික වූ අභිචාරකර්මයක් ලෙස හඳුන්වා දිය හැකිය (මීගස්කුඹුර, 1995: 110).

විවිධ මූලාශ්‍රයවලින් ලැබෙන තොරතුරු අනුව වැදි ජනයා අදහන කිරිඅම්මාවරුන්ගේ නම් රාශියක් හඳුනාගත හැකි ය. එනම්, ඉදිගොල්ලේ කිරිඅම්මා, කුකුළාපොළ කිරිඅම්මා, උනාපාන කිරිඅම්මා, වෙල්ලස්සේ කිරිඅම්මා, බිලිඳු කිරිඅම්මා, මහකිරිඅම්මා, බාලගිරි කිරිඅම්මා, හල්තොට කිරිඅම්මා, කපුයායේ කිරිඅම්මා, ඉනාවැල්ලේ කිරිඅම්මා, දොඹගහවෙල කිරිඅම්මා, අඹරාපොති කිරිඅම්මා ආදි වශයෙනි (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 201, 202). එසේ ම තම පරපුරේ ආදිතමයා බවට පත් වූ කුවේණියගේ අවතාරයක් ලෙස කුකුළාපොළ කිරිඅම්මා වැදි ජනතාවගේ ගෞරවාදරයට පත් වූ තැනැත්තියකි. (මීගස්කුඹුර, 1995: 110).

වැදි ජනතාවගේ 'කිරිකොරහ' නැටීම ද මේ කිරිඅම්මා සංකල්පයට සම්බන්ධ වූවකි. මෙහි දී ඔවුහු සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් සැලකෙන 'කිරි' සංකේතවත් කරමින් 'පොල්කිරි' යොදා ගනිමින් කොරහ වැනි බඳුනකට දමා, එය මුක්කාලිය පිට තබා ඒ වටා නටමින් යාදිනි කියති. ප්‍රධාන වශයෙන් දඩයම් පිණිස සතුන් ලබා දෙන ලෙස ඉල්ලීමක් ද මෙහි දී සිදු කරනු ලබන අතර මෙම වත්පිළිවෙත් සඳහා මස් මාංශ යොදා නොගැනීම මෙහි දක්නට ලැබෙන විශේෂත්වයකි.

ලංකාවේ මහවැලි ගඟ ආශ්‍රිත ව වෙසෙන වැදි ජනතාව විසින් 'ගිරිඅම්මාවරු' නමැති දේව සංකල්පයක් අදහනු ලැබේ. මෙහි දී සියඹලා ගසක් යට මැස්සක් තනා රත්මල්, බුලත්, පඬුරු ආදියෙන් ගිරිඅම්මා පුදා ඔවුන් ද කා බී නටා විසිර යෑම සිරිතක් ව පැවතිණි. මෙම චාරිත්‍රය බොහෝ විට කිරිකොරහ නැටීමට සමාන බවක් දක්නට ලැබේ. සිංහල භාෂාවේ ක, ග, හ, යන අක්ෂර ත්‍රිත්වය සඳහා දෙමළ භාෂාවේ එක් අක්ෂරයක් භාවිත වන අතර ඒ සඳහා උච්චාරණ කිහිපයක් යෙදෙන බැවින් කිරිඅම්මා, ගිරිඅම්මා බවට පත් වූ බවට ද අනුමාන

කළ හැකි ය. සිංහල ජනයාගේ කිරිඅම්මා පිළිබඳ විශ්වාසය පත්තිනි දේවිය හා සම්බන්ධ වන අතර වැදි ජනයාගේ ඇදහිලි ද මේ හා සමාන බවක් දක්නට ලැබේ. වැදි ජනතාව අතර පත්තිනි දේවිය ඇතැම් විට 'හලඹ කුමාරි කිරිඅම්මා' සහ 'හඳුන් කුමාරි කිරිඅම්මා' යන නම්වලින් ද හඳුන්වන බව සඳහන් වේ (ධර්මදාස සහ තුන්දෙණිය, 1994: 102). පත්තිනි දේවිය අඹරාපොති කිරිඅම්මා ලෙසින් ද වැදි ජනයා අතර ප්‍රචලිත බවට මතයක් පවතී (මීගස්කුඹුර, 1995: 110). කෙසේ වුව ද කිරිඅම්මාවරුන්, ප්‍රදේශීය නායිකාවන් හෝ ප්‍රදේශීය නායකයින්ගේ භාර්යාවන් හෝ වන බව වැදි ජනයාගේ පිළිගැනීමක් වශයෙන් පවතින බවක් ද දක ගත හැකි ය.

එමෙන් ම සිංහල සමාජයේ පවතින ගිරිදේවි - දළකුමාර ජනශ්‍රැතිය ද මෙහි දී අපට වැදගත් වේ. ගිරි ලෙනක සඟවා සිටි බැවින් ඒ කුමරිය ගිරි කුමරිය නම් වූවා ය. ඇය සියදිවි නසා ගත් පසු ගිරිදේවිය නමින් දේවත්වයට පත් වූ බව පෙනේ. ගිරි දේවිය ගිරිඅම්මා වී පසුව කිරිඅම්මා වූවා' ද විය හැකි ය.

එමෙන් ම දකුණු පළාතේ දක්නට ලැබෙන ශාන්තිකර්මයක් වන රටයැකුම හෙවත් රිද්දි යාගයේ රිද්දි බිසවුන් සත්දෙන පිළිබඳ සංකල්පය ද පුරාණ වැදි ජන විශ්වාසයේ පැවති කිරිඅම්මා විශ්වාසය හා මිශ්‍ර වී ඇති බවක් නිගමනය කළ හැකි ය. කළුකුමාරයාගේ බලපෑමෙන් වඳ බවට පත් රිද්දි බිසෝවරුන් ඉන් අත්මිදීම සඳහා හේනක් කොටා කපු වපුරා ඉන් හටගන්නා කපු නෙළා, නූල් දික්ගසා, නොයිඳුල් සළුවක් වියා ලොවුතුරා (දීපංකර) බුදුන්ට පූජා කළ යුතු යයි නෛමිත්තිකයෝ පැවසූහ. ඒ සඳහා රිද්දි බිසෝ සත් කට්ටුව නැව් නැගී රුහුණේ උසන්ගොඩින් ගොඩබැස්සෝ ය. මේ හා සමාන අදහසක් කිරිඅම්මා පිදීමෙන් ද විවරණය වෙයි. බිලිඳුන්ට ඇති වන දෝෂාන්ධකාර දුරු කිරීමට ද, දරුවන් ලබා ගැනීමට ද කිරිඅම්මාවරුන් යැදීම සිදුවෙයි (කෝට්ටගොඩ, 1997: 38).

දකුණු පළාතේ (වලවේ නිම්නයේ) කිරිඅම්මාවරුන් හඳුන්වන්නේ රිද්දි බිසවුන් නමිනි. ඒ හා බැඳුණු ජනශ්‍රැතියක් ද අසන්නට ලැබේ. විල්ලෝඩි දේශයේ උඩයක්කු හෙවත් සිද්ධි යකුන් නමින් හැඳින්වෙන යකුන් සත්දෙනාගේ භාර්යාවන් රුවල් නැවක නැගී ලක්දිවට ගොඩබැස වලවේ ගඟ දිගේ සමන්ත කූටයට යන ගමනේ රන්මුතු ඇල්ලෙන් ස්නානය කරන අවස්ථාවේ සැඬොලෙකු විසින් අත අල්ලනු ලැබීමෙන් වේදනාවට පත් ව එක් බිසවක් ඇල්ලට පැන සියදිවි නසා ගත්තා ය. අනෙක් බිසෝවරු ද ඇල්ලට පැන දිවි නසා ගත්තෝ ය. මොවුන් සත්දෙනා පසුව රිද්දි බිසවුන් බවට පත් ව ජනයාගෙන් පුද ලබන්නට වූහ (කෝට්ටගොඩ, 1997: 39).

වර්තමානයේ කිරිඅම්මාවරුන් පත්තිනි හා මිශ්‍ර වූ බවක් දක්නට ලැබේ. අතීතයේ කිරිඅම්මාවරුන් ලංකාවේ ම උපන් දෙවිවරුන් (දේවතාවියන්) සත්දෙනෙකු බව අනුමාන කළ හැකි ය. කුඩා දරුවන් හා කිරිදෙන අම්මලාගේ රෝගාබාධවලට හා ආරක්ෂාවට කැප වූ අම්මාවරුන් හත් දෙනා එක ම දේව මූර්තියකි. පත්තිනි සත් පත්තිනි බවට පත් වූයේ ලංකාවේ දී ය. ලංකාවේ ඈත අතීතයේ සිට පැවති කිරිඅම්මා විශ්වාසයට පත්තිනි සංකල්පය එකතු වූයේ නුවර යුගයේ පැවති තදබල හින්දු බලපෑම හේතු කොට ගෙන විය යුතු ය. (රත්නපාල, 1995: 109). මේ අනුව ලක්දිව අතීත වැදි ජනයාගේ ඇදහිල්ලක් වූ කිරිඅම්මා පිදීම එක් අතකින් රිද්දි බිසවුන් සත්දෙනා වශයෙනුත් අනෙක් අතින් සත්පත්තිනි වශයෙනුත් දෙයාකාරයකින් විකාශනය වී ඇති බව පෙනේ.

## කිරිඅම්මා දානය

පත්තිනි මෑණියන් උදෙසා පවත්වනු ලබන විවිධ පුද පූජා අතර කිරිඅම්මා දානය සුවිශේෂී ගෘහ ශාන්තිකර්මයක් ලෙස හඳුන්වා දිය හැකි ය. පත්තිනි දේවිය උදෙසා මහත් භක්තියකින් සිදු කරන මේ ශාන්තිකර්මය ලංකාවේ සෑම ප්‍රදේශයක ම පාහේ දක්නට ලැබේ. විශේෂයෙන් ම මෙය සිදු කරනු ලබන්නේ පත්තිනි දේවියට වූ භාරයක් ඔප්පු කිරීම සඳහා වූ පූජාවක් වශයෙනි.

ඒ අනුව 'කිරිඅම්මා දානය' වූකලී පත්තිනි දේව මාතාව මුල් කර ගෙන බෞද්ධ නිවෙස්වල පැවැත්වෙන ඉතා චාම් පූජා විධියකි. වර්තමානයේ දී බොහෝ විට මෙය පැවතෙන්නේ ස්වකීය පවුලේ දියුණුව, ඇස්වහ, කටවහ දුරු කොට නිවසේ ශ්‍රියාව වර්ධනය කර ගැනීම, යක්ෂ භූත ආදීන්ගෙන් පැමිණෙන උපද්‍රව දුරු කර ගැනීම, ස්වකීය ගොවිපොළවල ආලපාළු මඟහරවා අස්වනු වැඩි කර ගැනීම, දරුවන් නැති කාන්තාවන්ට දරුපල ලබා ගැනීම, අවිවාහක කාන්තාවන්ගේ විවාහ කටයුතු සාර්ථක කර ගැනීම, නඩුහබ ආදියෙන් සහනයක් ලබා ගැනීම ආදී වූ අපේක්ෂා ඉටු කර ගැනීම සඳහා පත්තිනි දේවතාවිය වෙනුවෙන් කිරිඅම්මාවරුන්ට පිදෙන දානයක් වශයෙනි. මෙය නාමයෙහි පරිසමාප්ත අර්ථයෙන් ම 'කිරි' ප්‍රධාන වෙයි. මෙසේ කිරිබත්, කිරිකැඳ, කිරිඅළුවා යොදා ගනිමින් සහ 'කිරි ඉතිරවීම' ආදියෙන් සමන්විත ව කිරිඅම්මාවරුන් සමූහයක් ඉදිරියේ ඉතා ගෞරව සහිත ව පිදෙන පිදවිල්ල, කිරිඅම්මා දානය නමින් හැඳින්වේ. භාග්‍යයේ හෙවත් සශ්‍රීකත්වයේ සංකේතයක් වන 'කිරි' සහ එනමින් ම පිදෙන මේ පිදවිල්ල ක්‍රමානුකූල ව ඉටු කළහොත් ඒ මඟින් තමන් බලාපොරොත්තු වන නියම ප්‍රතිඵල ලබා ගත හැකි වනු ඇතැයි සිංහල සමාජය තුළ විශ්වාසයක් පවතී (ඇඳගම, 2003: 1203).

කිරිඅම්මාවරුන්ගේ දානය සඳහා පුර පක්ෂයේ කෙම්මුර දිනයක් තෝරා ගත යුතු බව පූර්වාචාරීන්ගේ උපදේශය වේ. ඒ අනුව යමින් අමාවක පසු වී දින තුනේ සිට පසළොස්වක පොහොය දිනය දක්වා වූ කාලය පැරැන්නෝ මේ සඳහා යොදා ගත්හ (පියතිලක හල්පෙ, 2019: 30). වර්තමානයෙහි ද මේ සඳහා කෙම්මුර දිනයන් යොදා ගැනීම බෙහෙවින් ම සිදු වෙයි. ඒ අනුව දේව පූජාවලට බදාදා සහ සෙනසුරාදා යන දෙදින බොහෝ විට යොදා ගන්නා ආකාරය දක්නට ලැබේ. 'කෙම්' යන්නෙන් ආරක්ෂාව හෝ ශාන්තිය යන අර්ථ කියවෙයි. එය 'ක්ෂේම' යන්නෙහි තද්භව පදය යි. කෙම්මුර, කෙම්මර හෝ කෙම්වර යනු ශාන්තිකර්මවල දී පවත්වන පුද පූජා ආදිය යි (විජයතුංග, 1982 - I: 557). ඒ අනුව ආරක්ෂාව හෝ ශාන්තිය ලබාගැනීම සඳහා සිදු කරන පුද පූජා කෙම්මුර නමින් හැඳින්විය හැකි ය. එම පුද පූජා පවත්වන දින කෙම්මුර දින යනුවෙන් හැඳින්වෙයි. බදාදා සහ සෙනසුරාදා යන දෙදින එයට අයත් වෙයි.

විශේෂයෙන් ම කිරිඅම්මලාගේ දානය සෙනසුරාදාට ම යොදා ගැනීම මඟින් අපේක්ෂා කරන ශාන්තිය නියත වශයෙන් ම ලැබෙන බව බොහෝ ගැමියන්ගේ පොදු මතය බවට පත් ව ඇත. එය පොදු මතයක් බවට පත්වීමට හේතු වී ඇත්තේ කිරිඅම්මාවරුන් බවට පත් ව ඇති උඩයකුන් හෙවත් සිද්දි යකුන් සත් දෙනාගේ භාර්යාවන් වන රිද්දි බිසෝවරුන් සත්දෙනා ලංකාවට ගොඩබැස්සේ යැයි සැලකෙන දිනය සෙනසුරාදා දිනයක් වූ බැවිනි. එහෙයින් එදිනට මෙම දානය පිළිගැන්වීම වඩා සුදුසු බවට පවතින විශ්වාසය තහවුරු වී ඇති බව සඳහන් කළ හැකි ය (ලලිතා, 2022.08.30).

අම්මාවරුන්ගේ ලෙඩ නමින් හැඳින්වෙන වසංගත රෝගයක් වැලඳුණු විට හෝ දරු උපතකට පෙර හෝ එසේත් නැත්නම් තමන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් කර ගැනීම පිණිස හෝ පත්තිනි මෑණියන්ට භාරයක් වී එය ඔප්පු කරනු පිණිස කිරිඅම්මාවරුන් විෂයෙහි දානයක් දීම චිරාත් කාලයක පටන් අප සමාජයෙහි විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් අතර පවත්නා සිරිතකි.

මහත් අනුහස් ඇතැයි විශ්වාස කෙරෙන කිරිඅම්මාවරුන්ගේ දානය, පත්තිනි දානය, කිරි දානය, කිරිඅම්මා දානය සහ කිරිඅම්මලාගේ දානය ආදි නම්වලින් ද හැඳින්වේ. පුර පක්ෂයේ කෙම්මුර දිනයෙක උදෑසන මෙය පිරිනැමිය යුතු ය. මේ දානය සඳහා සහභාගි වන ලෙස කිරිඅම්මලාට ආරාධනා කරනුයේ ඊට පෙර දිනයේ දී ය. ඇතැම් විට දින කිහිපයකට පෙර ය. ඒ සඳහා බුලත් කොළයක් පිරිනමා ආරාධනා කිරීම සාමාන්‍ය චාරිත්‍රය යි. මේ සඳහා වඩාත් සුදුසු වන්නේ කුඩා දරුවන්ට කිරි දෙන මව්වරුන් බව බොහෝ දෙනාගේ විශ්වාසය

වෙයි. එහෙත් එවැනි මව්වරුන් සත්දෙනෙකු සොයා ගත නොහැකි අවස්ථාවල දී දරුවන් ලද වැඩිමහලු ස්ත්‍රීන් ද මේ සඳහා සහභාගි කරවා ගැනීම සිදු වේ (කරුණාවතී, 2022.02.29).

කෙසේ වුව ද දානය පිළිගැනීමට ආරාධනා ලබන ස්ත්‍රීන් සිල්වත්, ගුණවත් අය වීම ඉතා ම වැදගත් ය. ශාන්තියක්, සෙත් පැතීමක් සිදු කළ හැක්කේ එවැනි අයට ය. තමන් ළඟ ගුණයක් නැති අය සෙත් ශාන්ති කරන්නේ කෙසේ ද? උතුම් ගතිගුණ ඇති අය විසින් කරනු ලබන සෙත් ශාන්තියෙන් මහත්ඵල මහානිශංස ලැබේ (සීලවති, 2022.09.21).

කෙසේ වුව ද තෝරා ගත් දිනයට කිරිඅම්මා දානය සඳහා බුලත් දී ආරාධනා කළ යුතු ය. පත්තිනි මෑණියන් උදෙසා දානය පිරිනැමීමේ දී කිරිඅම්මාවරුන් තෝරා ගැනීම ඉතා පරිස්සමෙන් සිදු කළ යුතු වේ. ඒ සඳහා පහත ලක්‍ෂණ ඇති අය තෝරා නොගැනීමට වගබලා ගත යුතු ය.

ඒ අනුව හැරමිටි වාරුවෙන් යන අය, සුව කළ නොහැකි රෝග ඇති අය, අඳ හෝ බිහිරි අය, දරුවන් මිය ගිය කාන්තාවන්, වැන්දඹු කාන්තාවන්, වඳ ස්ත්‍රීන්, මස් මාළු විකුණන අය, මත්පැන් බොන අය, කේලාම් කියා එකිනෙකා කොටවන අය, වේශ්‍යා ස්ත්‍රීන්, අංශභාග, අපස්මාර රෝගී අය යනාදී ස්ත්‍රීන් තෝරා ගැනීමෙන් වැළකිය යුතු ය.

මෙසේ තෝරා ගත් කිරිඅම්මාවරුන් දින කිහිපයක සිට කිලිකුණුවලින්, මස් මාංශවලින් තොර ව පේ වීම වඩාත් ප්‍රතිඵලදායක වෙයි. දානයට පැමිණෙන කිරිමව්වරුන් සුදු වතින් සැරසී පැමිණිය යුතු අතර ඔවුන්ගේ පා දෝවනය සඳහා දෙහි මිශ්‍ර කහ වතුර බඳුනක් දොරකඩ අසල තැබිය යුතු ය (චන්ද්‍රලතා, 2022.02.01).

කිරිඅම්මාවරුන්ගේ දානයට සූදානම් වීමක් වශයෙන් පැරණි ගැමියා තම නිවසේ අලුතෙන් වහල සෙවිලි කර, බිම ගොම මැටි ගා පිරිසිදු කර ගත්තේ ය. එහෙත් වර්තමානයේ ඒ සඳහා සෝදා පිරිසිදු කර ගත් නිවස තුළ හා නිවස වටා හඳුන්කිරි පැන් ඉස, කට්ටකුමංජල් දුම් අල්ලා කිරිඅම්මාවරුන්ගේ දානය සඳහා අවශ්‍ය පවිත්‍ර වටපිටාව සකසා ගනු ලැබේ (පියතිලක හල්පෙ, 2019: 30). පවුලේ සියලු දෙනා ද ස්නානය කොට, පිරිසිදු වී මස් මාංශ අනුභවයෙන් සහ කිලි කුණුවලින් තොර ව පිරිසිදු ඇඳුමින් සැරසී පේ වී සිටිය යුතු ය.

මේ ශාන්තිකර්මය සඳහා මිදුලේ පහසු තැනක පහන් පැලක් තනාගත යුතු අතර නිවස තුළ ද පත්තිනි පූජාව තැබීම සඳහා එවැනි පහන් පැලක් (මල් යහනක්) තැනිය යුතු ය. කුඩා මේසයකට කෝටු තබා බැඳ ගැනීමෙන් නිවස තුළ පහන් පැල තනාගනු ලැබේ. මිදුලේ තනන පහන් පැල කිරිඅම්මාවරුන්ට දර්ශනය වන ආකාරයට තනාගත යුතු ය. නිවස තුළ

පහන් පැල නැතහොත් මල් යහන තනාගැනීමෙන් පසු ඒ අසලින් ම කිරි ඉතිරවීම සඳහා ලිප සකසා ගත යුතු අතර නැවුම් මැටි මුට්ටියකට එළකිරි හෝ පොල්කිරි දමා සූදානම් කොට තැබිය යුතු වේ. එමෙන් ම නිවස තුළ මල් යහන අසලින් කිරිමව්වරුන් සඳහා බිම පැදුරු දමා ඒ මත සුදු ඇතිරිල්ලක් එලා සකස් කොට තැබිය යුතු ය. (නිලන්ත කුමාර, 2015: 13).

කිරිඅම්මා දානය සඳහා පත්තිනි පූජාවට අවශ්‍ය පූජා භාණ්ඩ රාශියකි. එනම්, එක් වර්ගයකින් හත බැගින් කැවිලි වර්ග හත යි. මේ සඳහා කිරිබත්, කිරිඅළුවා, අතිරස, කැවුම්, අග්ගලා, මුංකැරලි, තලකැරලි ආදිය ඇතුළත් විය යුතු ය. එක් වර්ගයකින් හත බැගින් පළතුරු වර්ග ද හතකි. මේ සඳහා අඹ, කෙසෙල්, බෙලි, දිවුල්, කළුඋක්, අන්නාසි, දොඩම්, නාරං, වැල, වරකා ආදි නැවුම් පළතුරු අතුරෙන් සත් වර්ගයක් තෝරා ගත යුතු වේ. මීට අමතර ව බුලත් හතක්, පඬුරු හතක්, මැටි පහන් හතක්, පහන්තිර හතක්, තැඹිලි ගෙඩියක්, දූහැත් වට්ටියක් අවශ්‍ය වේ. දූහැත් වට්ටිය සකස් කර ගන්නේ බුලත්වලට අමතර ව එන්සාල්, ඉඟුරු පියලි ආදි සුවඳ ද්‍රව්‍යය ද එක්කර ගැනීමෙනි. එමෙන් ම මේ පූජා භාණ්ඩ අතරට ලදපස් මල්, කහ වර්ණයෙන් යුත් මල් මාලාවක් සහ කපුරු හඳුන්කූරු, පිනිදිය ආදිය ද ඇතුළත් විය යුතු ය. මේ සියලු ද්‍රව්‍ය භාවිත කරන්නේ පත්තිනි පූජාව සඳහා වන අතර එය සකස් කරන්නේ නිවස තුළ තිබෙන මල් යහනෙහි ය. මිදුලෙහි වූ පහන් පැල සඳහා ද මල්, පහන්, සුවඳ දුම්, පැන් හා දූහැත් ආදිය තැබිය යුතු වේ. එසේ ම කිරිමව්වරුන්ට පිළිගැන්වෙන දානය සඳහා ඉහත ආකාරයෙන් එක් අයෙකුට හත බැගින් කැවිලි වර්ග හතක් ද, එක් අයෙකුට හත බැගින් පළතුරු වර්ග හතක් සහ අනෙකුත් ද්‍රව්‍යය ද අවශ්‍ය වේ.

පෙර දිනයක දී ගොස් ආරාධනා කරන ලද කිරිමව්වරු උදේ පාන්දරින් ම දානය පැවැත්වෙන නිවස අසලට හෝ කඩුල්ල මුලට එක්රැස් වෙති. සාමාන්‍යයෙන් පාන්දර තුනත්, හතරත් අතර කාලයේ මොවුන්ගේ පැමිණීම සිදු වෙයි. එසේ වුව ද කිරිමව්වරුන්ගේ සංඛ්‍යාව සම්පූර්ණ වන තෙක් ඔවුහු නිවසට නො පැමිණෙති. ඔවුහු අදාළ සංඛ්‍යාව සම්පූර්ණ වන තුරු කඩුල්ල මුල රැඳී සිටිති. ඉන් පසුව කිරිඅම්මලා සත්දෙනා පෙළ සැදී ගමන් කරන විට පළමුවෙන් සිටින කණ්ඩායම් නායක කිරිඅම්මා පත්තිනි දෙවියන්ගේ රූපයක් ගෙන යා යුතු වේ. අතීතයේ නම් දළුමුර කරඬුව නම් පූජා භාණ්ඩයක් රැගෙන ආ බව සඳහන් වුවත් අද එවැන්නක් සිදු නො වේ (සුමනවංශ හිමි, 2020: 30 - 32).

කිරි දානය දෙන නිවස සමීපයට හෝ කඩුල්ල අසලට යන කිරිඅම්මලා එතැන නතර වී සිටිය දී නිවසේ අයෙකු මල් වට්ටියක් රැගෙන එහි පැමිණිය යුතු ය. එවිට කිරිඅම්මලා මෙම කවිය ගායනා කරති.

මුදු හදවත් බැතියෙන් පුරවන්නේ
සුදු පිරුවට ඇඳලා පේවෙන්නේ
බුදු වන පත්තිනි දෙවි නමදින්නේ
මිදුල ඉසව්වට ඇවිත් සිටින්නේ

(රත්නායක, 2013 : 17).

ගෘහිණිය හෝ වෙනත් අයෙකු ගෙදරින් ගෙනෙන ලද මල් වට්ටිය මෙහි දී නායක කිරිඅම්මාට භාර දුන් විට ඇය එයින් මලක් බිම දමා ඉදිරියට පිය තබන්නේ දෙවැනි කිරිඅම්මාට මල් වට්ටිය පිරිනමමිනි. ඇය වට්ටියෙන් මල් දෙකක් බිම දමා නැවත මල් වට්ටිය තෙවැනි කිරිඅම්මා අතට පත් කළ පසු ඇය එයින් මල් තුනක් බිම දමා සිවුවැනි කිරිඅම්මාට දිය යුතු ය. මේ අයුරින් සත්වැනි කිරිඅම්මා වට්ටියෙන් මල් හතක් ගෙන බිමට දමන්නී ය.

ඉන්පසු කිරිඅම්මාවරු මිදුලේ පසෙකින් තනා ඇති පහන් පැල වෙත ගොස් පහන් දල්වා මේ කවිය ගායනා කරති.

විතර නොවේ සක්වළ තුළ පත්තිනි තෙද බල
නිතර සරණ වෙන මුදු ගුණ රඳවා හද තුළ
පැතිර පවත්නා අණ වින බාධක මතු කළ
ඉතිරි නොවී දුරුවන් වෙයි මින් මතු හැම කල

(රත්නායක, 2013 : 18).

මේ කවිය කියා එතැන සිට මල් විසුරුවමින් නිවසට ගමන් කරන කිරිඅම්මාවරුන් වෙතින් පත්තිනි රූපය නිවසේ කෙනෙකු භාර ගනී. බොහෝ විට එය භාර ගනු ලබන්නේ එම නිවසේ ගෘහිණිය විසිනි. ඉන්පසු කිරිඅම්මලාගේ පා දෝවනය කොට ගෙතුළට කැඳවනු ලැබේ. පත්තිනි රූපය මල් යහනේ තැන්පත් කරනු ලබන්නේ පත්තිනි දෙවියන්ට භාර වූ තැනැත්තා හෝ තැනැත්තිය විසිනි.

පත්තිනි මෑණියන් සඳහා පූජාව තබන්නේ නිවස තුළ සකස් කර ගත් මල් යහන මත ය. මෙහි සුදු පිරුවටයක් එළා ඒ මත කෙසෙල් කොළ හෝ නෙළුම් කොළ මත පූජා භාණ්ඩ තැන්පත් කිරීම සිදු වේ. මෙහි තැන්පත් කරන ලද පත්තිනි දේව රූපයට කහ වර්ණ මල් මාලාවක් පැලඳවීම සිරිතකි. පත්තිනි දේව ප්‍රතිමාව ඉදිරිපිට ලදපස්මල් අතුරා හඳුන්කූරු දැල්විය යුතු ය. අනතුරුව හත බැගින් වූ කැවිලි හත් වර්ගය ද, පළතුරු සත් වර්ගය ද තැබිය යුතු වේ. එමෙන් ම දැහැත්, ගිලන්පස ආදිය ද මෙහි තැන්පත් කෙරේ. මේ හැර කහ දියරෙන් ධෝවනය කරන ලද පඬුරු ද තැන්පත් කළ යුතු ය. මෙහි පඬුරු යන්නෙන් අදහස්

කෙරෙන්නේ පත්තිනි දෙවියන්ට භාර වන අවස්ථාවේ සුදු රෙදි කැබැල්ලක ඔතා නිවසේ ඉහළ තැනක තබා තිබූ කාසිය යි. පහන් දල්වා සුවඳ දුම් අල්ලා මේ සියල්ල දෙවියන්ට පූජා කළ යුතු ය. කිරිමවුවරු පළමු ව තිසරණ සහිත පංච ශීලයෙහි පිහිටා බුද්ධ පූජාව තබා ඉන් අනතුරු ව පත්තිනි පූජාව ආරම්භ කරති (ගුණවතී, 2022.09.11).

මෙහි දී පළමු ව සිදු වන්නේ දේවාරාධනය යි. එය මෙසේ දැක්වේ.

"පස්වාන් දහසක් ආයුබෝවන්ඩ ශ්‍රී සිද්ධ පත්තිනි දේව ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ ඇතුළු කිරිඅම්මාවරු සත්දෙනෙකු ඉදිරියේ ඉතා පිරිසිදු ව පිළියෙල කරන ලද කැවුම්, කිරිබත්, රඹකැන් ආදියෙන් හා කපුරු සහිත සුවඳ දැහැත් විට ද පඬුරු සහිත ව ඉතා ගෞරවයෙන් පිළිගන්වන ලද මෙම දානය පිළිගෙන මෙම පවුලට කිසියම් ඇස්වහක්, කටවහක්, අතුරු ආන්තරාවක්, රෝග ව්‍යසනයක් යෙදී ඇත්නම් ඉදිරියට යෙදෙන්නට ඇත්නම් එකී නොකී සියලු දුක් අන්ධකාරයන් දුරින් ම දුරු කරවා සිරිසෙත ළඟා කර දෙන සේක්වා."

ඉන් පසුව පත්තිනි දේවාරාධනාව සඳහා ස්තෝත්‍ර ගායනා කෙරේ.

නානා සුන්දර ජනවනිතාගණ තාරපතී ඉව ශ්‍රී දේහං
නානා වර්ණක සාටක ධාරණ මාලාදාම පිලන්ධනං
නානා ශාස්ත්‍ර ප්‍රජා විජානන ඥාන විශාර ද කීර්තිධරං
නානා ශොභිත රත්න නිරන්තර දදාතුතෙ පත්තිනි මාතා

(ගුණසේන, 2020: 06)

මෙසේ පත්තිනි දෙවියන්ට ස්තෝත්‍ර ගායනා කිරීමෙන් පසු කිරිමව්වරුන්ට දානය පිළිගැන්වීම සිදු කෙරේ.

පත්තිනි දෙවියන් වෙනුවෙන් සිදු කරන පුද පිළිවෙත් නිම වීමෙන් පසු කිරිඅම්මාවරුන්ට දානය පිළිගැන්වීම සිදු වේ. දානය වැළඳීම සඳහා ඔවුන් වාඩි කරවිය යුත්තේ පැදුරක් එළා ඒ මත සුදු පිරුවටයක් එළීමෙන් පසුව ය. දානයට වාඩි වීමට පෙර වස් දොස් දුරු කිරීම සඳහා සෙත් කවියක් ගායනා කරනු ලැබේ. එය මෙසේ දැක්විය හැකි ය.

වැඩලා නේරංජන ගඟ වැල්ලේ
සතියක් වැඩ සිට බෝ සෙවණැල්ලේ
පියුමක් පිපුණා ඒ සුදු වැල්ලේ
වස් නැත ඉඳගන්නට ඇතිරිල්ලේ

(පියතිලක හල්පෙ, 2019 : 36).

ඔවුන් පැදුරු මත එළන ලද සුදු ඇතිරිල්ලේ වාඩිවීමෙන් පසු කඩදාසියක් (පත්තර පිටුවක්) සහ කෙසෙල් කොළයක් පළමු ව දිය යුතු ය. පත්තර පිටුව මත කෙසෙල් කොළය එළාගත් පසු, කොළ සහිත දෙහි අත්තකින් හඳුන්කිරි පැන් ඉස දානය බෙදිය යුතු ය. එක් කිරිඅම්මා කෙනෙකුට එක් වර්ගයකින් හත බැගින් කැවිලි හත් වර්ගයක් ද, එක් පළතුරු වර්ගයකින් හත බැගින් පළතුරු හත් වර්ගයක් ද වශයෙන් වර්ග හතෙන් හතළිස් නවයක් පූජා කළ යුතු ය. ඉන්පසු කෝපි බඳුනක් සහ බුලත් විටක් පිළිගැන්විය යුතු වේ. එමෙන් ම බුලත් කොළයක තබන ලද පඬුරක් ද (මෙය පවත්නා මූල්‍ය වටිනාකම අනුව වර්තමානයට සරිලන මුලදක් විය යුතු ය.) පිදිය යුතු පුජා භාණ්ඩ අතර වෙයි. අවසාන වශයෙන් වැටි දෙකක් දල්වා සකසන ලද මැටි පහන බැගින් කිරිඅම්මාවරුන් සත්දෙනා අත තැබිය යුතු ය.

කිරිඅම්මාවරු දානය පිළිගැනීම වෙනුවෙන් යාදින්නක් කියති. පත්තිනි දෙවියන් වෙනුවෙන් කරන මෙම යාතිකාවෙන් රෝග පීඩා දුරු කර සියල්ලන්ට ම සුභ සෙත උදා කරන ලෙස ආයාචනා කෙරේ (පියතිලක හල්පෙ, 2019: 37).

"ආයුබෝවන්ඩ,

මතු බුදු වන ශ්‍රී සිද්ධ පත්තිනි දෙවි ස්වාමීන් වහන්ස! ඔබ වහන්සේගේ පතිවත බල මහිමය කරණ කොට ගෙන පඬි රට සිතලව නම් පඬි රජු ඇතුළු සතුරන් සමූල ඝාතනය කොට, මුළු ලොවට ම ඔබ මහිමය පෙන්වා සත් වාරයක් සත් නාමයකින් ජනිත ව බලය පැතිරූ සත් පත්තිනි දේවීන් වහන්ස අද ඔබ වහන්සේගේ ශ්‍රී නාමය සිහිපත් කරමින් අඩුක්කු මල් පහන් පුද දෙන මේ අසරණ ගැත්තන්ට අනුකම්පා කර, දිවැස් බලා වදාරා ඔවුනට වැළඳී තිබෙන්නා වු ඇස්වහ, කටවහ, අණ වින, ලොඩ රෝග, අතුරු අන්තරා, ව්‍යාධි, ආලපාළු දුරීභූත කොට ඔවුන්ගේ අඹු දරුවන්ගේ, ගේ දොර, හරක බාන, වතුපිටි, ගොවිතැන්, රැකී රක්‍ෂා මෙකී නොකී සියල්ල ආරක්‍ෂා කර ඔවුන්ගේ සියලු වියවුල්, සිත්තැවුල්, අඩුපාඩු මඟහරවා, යස ඉසුරු ළඟා කර දෙන මෙන් ඉල්ලා සිටිමු. තව ද ඔබ වහන්සේගේ ශ්‍රී නාමය සිහි කර ඒ වෙනුවෙන් අප ඉදිරියේ තබා ඇති සියලු අංගයන්ගෙන් සම්පූර්ණ වු මේ දාන වස්තුව අප විසින් පිළිගැනීම හේතු කොට ගෙන ඔවුන් ලබන පුණ්‍යකර්මයේ බල මහිමය ඔබ වහන්සේට ද අත්පත් වීමෙන් මතු බුදු වන පත්තිනි දේව ස්වාමීන් වහන්ස ඔවුන් ආරක්‍ෂා කර දෙන සේක්වා."

මෙහි දී කිරිඅම්මාවරු තමන්ට බෙදන ලද ආහාරවලින් ස්වල්පය බැගින් අතුල්පතකට දමති. එය පැන් වීදුරුවක් ද සමඟ මළගිය ඥාතීන්ට පුදා 'ඉදං මේ ඥාතීනං හෝතු' යන ගාථාව

කියා පින් පැමිණවිය යුතු ය. නිවසට හා නිවැසියන්ට දේවාරක්ෂාව ප්‍රාර්ථනා කිරීමෙන් පසුව කිරිඅම්මාරු දානය ඉඳුල් කරති. ඉතිරිය තම නිවසට ගෙන යෑම සඳහා තබා ගනිති.

මදුරාපුරය ගිනි ලෑමෙන් පසුව එම ගිනි නිවීම සඳහා කිරි උතුරුවන ලෙස පත්තිනිය විසින් නියෝග කළ බව පත්තිනි හෑල්ලේ සඳහන් වේ (ගුණසේන, 2020: 55). එය අනුගමනය කරමින් අප රටේ පත්තිනි පූජාවන්හි දී ද කිරි ඉතිරිවීම සිදු කෙරේ. කිරිඅම්මාවරුන්ගේ දානය පිරිනමන අවස්ථාවන්හි දී පත්තිනි දෙවියන් වෙනුවෙන් කිරි ඉතිරවීම සුලබ ව දක්නට ලැබේ. එහි දී කිරි මුට්ටියෙහි සතර පැත්තෙන්ම කිරි උතුරා යන තුරු පස් තෙල්වලින් පෙඟවූ, දල්වන ලද පහන් වැටි හතක් අතින් ගෙන කිරිඅම්මාවරු ජය පිරිත සජ්ඣායනා කරති. කිරි මුට්ටිය උතුරා ගිය පසු එහි කට රෙදි කඩකින් වසා බැඳ නිවසේ සුදුසු ස්ථානයක එල්ලා තැබීම පැරැන්නන්ගේ සිරිත විය (පියතිලක හල්පෙ, 2019: 38, 39). කිරි ඉතිරවීමෙන් පසු කිරිඅම්මලාගේ කන්නලව්ව සහ කිරිඅම්මාවරුන්ගේ ශාන්තිය ආදී පුද පිළිවෙත් පවත්වනු ලැබේ.

ඉන් පසුව කිරිඅම්මාවරු නැගිට ගොස් පත්තිනි දේව ප්‍රතිමාවට වැඳ නමස්කාර කොට දල්වන ලද පහන් වැටි අතින් ගෙන ආතුරයාගේ හිස වටා තුන්වරක් කරකවා, කිරි පොල් කටුවකට හෙළා නිවා දමන අතර සෙත් කවි ගායනා කරමින් සෙත් පැතීම ද සිදු කරති. ඇතැම් ගම්බද නිවෙස්වල මෙම කිරි පොල්කටුව වහලයට උඩින් විසි කිරීම හෝ කිරි ඉසීම සිදු වෙයි. මෙයින් පසුව සිදු කරන්නේ පත්තිනි දෙවියන් අබියස දල්වන ලද පහනින් තෙල් ස්වල්පයක් ඇඟිලි තුඩට ගෙන නිවැසියන්ගේ හිස ගැල්වීම ය. අවසන් වශයෙන් දෙවියන්ට පින් දී, තම දානෙ කොටස ද රැගෙන කිරිඅම්මාවරු නිහඬ ව නිවසින් පිට ව යති.

## කිරිඅම්මා දානයේ වෙනස්කම්

කිරිඅම්මා දානය, අම්මා දානය, කිරි දානය, කිරි දේව දානය, පත්තිනි දානය, සිද්ධ පත්තිනි දානය, කන්නගි දානය (සූරියබණ්ඩාර, 2018: 11) ආදී වශයෙන් විවිධ නම්වලින් හැඳින්වෙන, පත්තිනි මෑණියන් ප්‍රධාන කොට ගෙන කිරිඅම්මාවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන කිරිඅම්මලාගේ දානය වූකලි සිංහල සමාජයෙහි ගෘහාශ්‍රිත ව පවත්වන අභිචාර විධි අතර බෙහෙවින් ප්‍රචලිත ශාන්තිකර්මයකි. කිරිඅම්මාවරුන්ට මේ දානය පිළිගන්වනු ලබන්නේ පත්තිනි මෑණියන් වෙනුවෙනි. ඔවුන් එය පිළිගන්නේ ද සත්පත්තිනි මෑණියන් වෙනුවෙනි. එහෙයින් මේ දානය පත්තිනි පූජාවක් ලෙස දැක්විය හැකි ය.

කිරිඅම්මලාගේ දානය නම් වූ මේ ශාන්තිකර්මය විමසීමේ දී ඒ පිළිබඳ පොදු පිළිවෙතක් දක්නට ලැබේ. ලංකාවේ විවිධ ප්‍රදේශවල පවත්වන මේ පූජාව සහ ඒ පිළිබඳ ලියවී ඇති ලිපි ලේඛනවල දැක්වෙන ආකාරයට එය මෙසේ දැක්විය හැකි ය.

- කිරිඅම්මාවරුන්ට බුලත් දී ආරාධනා කිරීම.
- කිරිඅම්මාවරුන්ගේ පැමිණීම සහ නිවසට පිළිගැනීම.
- බුද්ධ පූජාව තබා පන්සිල්හි පිහිටීම.
- පත්තිනි දෙවියන්ට ආරාධනා කොට පූජාව කැප කිරීම.
- කිරිඅම්මලාට දානය පිළිගැන්වීම.
- කිරිඅම්මලා විසින් තමන්ට පිළිගැන්වූ දානයෙන් කොටසක් මළගිය ඥාතීන් වෙනුවෙන් වෙන් කොට ඉතිරියෙන් කොටසක් වැළඳීම.
- ආතුරයාට හෝ නිවැසියන්ට ශාන්තිය සහ දේවාශිර්වාදය ලබා දෙන ලෙස කිරිඅම්මාවරුන් විසින් දෙවියන්ට කන්නලව් කරනු ලැබීම.
- දෙවියන්ට පින්දීම සහ සෙත් කවි කීම.
- කිරි උතුරුවා ආතුරයාට හෝ නිවැසියන්ට සෙත් පැතීම.
- පහන්තිර නිවා නිවසින් පිට ව යෑම.

එහෙත් ඇතැම් ප්‍රදේශවල මේ පිළිවෙත් පැවැත්වීමේ දී ඒ පිළිවෙත් පවත්වන ආකාරයේ යම් වෙනස්කම් ද දක්නට ලැබේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට ප්‍රදේශයේ පැවැත්වෙන මේ දානය සඳහා කිරිඅම්මලාට බුලත් දී ආරාධනා කිරීම දින හතකට පෙර සිදු කිරීමත්, දානය පැවැත්වෙන දිනයේ කිරිඅම්මලා නිවසට පැමිණි පසු මිදුලේ දී ගෘහිණිය විසින් නැවත වරක් බුලත් දී දානය සඳහා ඔවුන්ට ආරාධනා කිරීමත් මෙහි විශේෂ චාරිත්‍රයකි. දානය සඳහා කිරිඅම්මාවරු වැඩිමහලු පිළිවෙළට ඉඳ ගැනීමත්, ප්‍රධාන කිරිඅම්මාට ගෘහිණිය විසින් යාර තුනකින් යුත් සුදු පාට හෝ කහ පාට සළුවක් පිරිනැමීමත් මේ ප්‍රදේශයේ කිරිඅම්මා දානයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ලෙස සඳහන් කළ හැකි ය. මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ කිරිඅම්මාවරු ඉදිරිපිට තබන ලද පහන්වල පහන් තිර දෙකක් දෙපසට විහිදුවා දැමීම සහ පළමු ව එක් පහන්තිරයක් පමණක් දල්වීම යි. එමෙන් ම මේ ප්‍රදේශයේ දානය සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය අතර හකුරු කැබලි හතක් සහ තැඹිලි හතක් තැබීම ද දක්නට ලැබෙන විශේෂයකි (ගුණවතී, 2022.09.11).

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාමඩල ප්‍රදේශයේ පවත්වන කිරිඅම්මා දානයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ අතර දානය සඳහා ගන්නා ද්‍රව්‍ය අතර විශේෂත්වයක් පවතී. එහි දී මල්මාල හතක්, බුලත් හතක් යොදා ගන්නා ආකාරය දක්නට ලැබේ. මෙහි කිරිඅම්මාවරු ඉදිරිපිට තබන පහන්තිර දෙකක් දමූ පහන්වල තිර දෙක ම එකවර දැල්වීම ද විශේෂිත ය. මෙම ප්‍රදේශයේ ද අනෙක් ප්‍රදේශවල මෙන් කිරි ඉතිරවීමේ චාරිත්‍රය දක්නට ලැබෙන අතර ඒ සඳහා එළකිරි හෝ පොල් කිරි පමණක් නො ව එයට හීනටි වී, සුනුසහල් ආදිය ද එකතු කර ගනී. එමෙන් ම කිරි ඉතිරවීමෙන් පසු මුට්ටියේ කට ගැටගසා වහලේ කිසියම් ස්ථානයක එල්ලා තැබීම ද මේ ප්‍රදේශයේ කිරිඅම්මා දානයේ දක්නට ලැබෙන තවත් විශේෂත්වයකි (කරුණාවතී, 2022.02.29).

මාතර දිස්ත්‍රික්කයේ මාතර ප්‍රදේශයේ කිරිඅම්මා දානයේ දී ද විශේෂ ලක්ෂණ කිහිපයක් දැක ගත හැකි ය. මේ ශාන්තිකර්මය අවසානයේ දී මිදුලේ පසෙක තබන ලද පොල් ගෙඩියක් සහ ඊට උඩින් බුලත් කොළ කිහිපයක් ද, කාසියක් ද, දෙහි ගෙඩියක් ද තබා ප්‍රධාන කිරිඅම්මා විසින් ඒ සියල්ල හසු වන සේ කැත්තකින් ගසා පොල් ගෙඩිය බිඳ දමනු ලැබේ. එය විශේෂයකි. එමෙන් ම සියලු ම පිළිවෙත් අවසන් කොට කිරිඅම්මාවරුන් පිට ව යෑමේ දී නිවස ඉදිරිපිට තබන ලද ජලය පිරවූ කළය එකිනෙකාගේ පාදවලින් අල්ලා පෙරලා හැරීම මෙහි දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයකි (චන්ද්‍රලතා, 2022.02.01). සියලු වස්දොස් දුරහැරීම ඒ මගින් ධ්වනිත වෙයි.

මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවණගල ප්‍රදේශයේ පවත්වන කිරිඅම්මා දානයේ ද වෙනස්කම් කිහිපයක් දැකගත හැකි ය. මෙහි දී ප්‍රධාන කිරිඅම්මා හෙවත් 'මහකිරිඅම්මා' සියල්ලන්ට ම පෙර පැමිණෙන අතර පත්තිනිය උදෙසා අලංකාර මල් යහනක් ඇය විසින් සකස් කරනු ලැබේ. ඉන් පසුව සියලු ම කිරිඅම්මලා පැමිණි පසු ඔවුන් හා එක් ව පත්තිනි මල්යහන වෙත ගොස් ආශිර්වාද ලබා ගෙන ඉඳ ගැනීම ද මෙහි විශේෂ ලක්ෂණයකි. එමෙන් ම නිවැසියන් ද එක් කොට ගෙන තුන් නූල් ඇද පිරිත් සජ්ඣායනා කිරීම අනෙක් කිසිදු ප්‍රදේශයක දක්නට නොලැබෙන ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය (සිලවතී, 2022.09.21).

## සමාලෝචනය හා නිගමනය

ජනශ්‍රැතිය යනු ජන සමාජයක් අතර මුඛ පරම්පරාගත සම්ප්‍රදායෙන් පැවත එන සාමූහික දැන නුවණ හෙවත් ඥාන සම්භාරය යි. කුමන සමාජයක වුව ද එම ජනතාවගේ සංස්කෘතිය හඳුනා ගත හැක්කේ ජනශ්‍රැතිය මගිනි. මෙහි අංග රාශියක් දක්නට ලැබෙන අතර ඇදහිලි, විශ්වාස හා අභිචාර ආදිය ද එයට අයත් වේ.

ලොව දේව සංකල්පය ආරම්භ වන්නේ සොබාදහම කෙරෙහි මිනිසා තුළ පැවති බිය හා ගෞරවය හේතු කොට ගෙන ය. සොබාදහමේ යථාර්ථය හෙවත් ක්‍රියාකාරිත්වය අවබෝධ කර ගැනීමට අපොහොසත් වූ ආදි මිනිසා එම ක්‍රියාවන්ට දේවත්වයක් ආරෝපණය කළේ ය. ඒ අනුව විශ්වය තුළ ක්‍රියාත්මක වන සියල්ල ආදෘශ්‍යමාන ව සිටින එම දෙවිවරුන්ගේ බලමහිමය යයි කල්පනා කොට ඒවාට වැඳුම් පිදුම් කරන්නටත්, පුදපූජා පවත්වන්නටත්, කන්නලව් කරන්නටත් හුරු වූයේ ය. පසු කාලීන ව එම සමාජවල ඒ ඒ ක්‍රියාකාරිත්වයන් සඳහා ඔවුහු වෙන වෙන ම දෙවිවරුන් නිර්මාණය කර ගත්හ. අභිචාර විධි පහළ වන්නේ එම දෙවිවරුන් වෙනුවෙන් සිදු කරන පුද පූජා හා වත්පිළිවෙත් ආදිය ඇසුරු කොට ගෙන ය. ඒ අනුව සිංහල සමාජය තුළ දක්නට ලැබෙන පත්තිනි දේව ඇදහිල්ල හා කිරිඅම්මාවරුන් පිදීම එසේ ඇති වූ අභිචාර විධියකි. මේ මඟින් මිනිසා බලාපොරොත්තු වූයේ සොබාදහමේ විවිධ අභියෝගවලට මුහුණ දෙමින් තම ලෞකික දිවිය සරු කර ගැනීම යි.

ලක්දිව දේව ඇදහිල්ලේ ආරම්භය කවදා කෙසේ සිදුවිණි දැයි කිව හැකි නො වේ. කෙසේ වුව ද අනාදිමත් කාලයක සිට ලක්වැසියා දේව වන්දනයෙහි නිරත ව සිටි බවට තොරතුරු අනාවරණය කරගත හැකි ය. සිංහල සමාජය තුළ මෙසේ ආරම්භ වූ දේව සංකල්ප පිළිබඳ විශ්වාසය ලක්දිවට බුදුසමය පැමිණීමත් සමඟ යම් වෙනසකට ලක් වූ බව පෙනේ. ඒ අනුව ලක්දිව දේව ධුරාවලියෙහි බුදුන්වහන්සේට ඉහළ ම තැනක් හිමි වූ අතර උන්වහන්සේ දේවාති දේව, බ්‍රහ්මාති බ්‍රහ්ම ලෙසින් හඳුන්වනු ලැබූහ. එසේ වුව ද අනාදිමත් කාලයක සිට පැවත ආ මේ දේව වන්දනය හා ඒ පිළිබඳ විශ්වාසයන් ලක්දිව තුළ බුදු දහම ස්ථාපනය වීමෙන් අනතුරු ව වුව ද පහ ව නොගිය බව ලාංකේය දේව වන්දනයේ විකාශනය තුළින් විද්‍යමාන වේ.

ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන්නේ ථේරවාදී බුදු දහම යි. එය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. ඒ ප්‍රතිපත්ති හා ආමිසය යනුවෙනි. ප්‍රතිපත්ති කිසි විටෙකත් වෙනස් නො වේ. එහෙත් ආමිසය ජනතාවගේ අවශ්‍යතාව මත වෙනසකට බඳුන් වී ඇති බව සඳහන් කළ හැකි ය. වර්තමානයේ ලාංකිකයා අදහන ආගම නැතහොත් අපේ ජන ආගම නිර්මාණය වී තිබෙන්නේ මෙසේ බුදු දහමේ එන ආමිසයට විවිධ ඇදහිලි, විශ්වාස එක් වීමෙනි. බුදු දහමෙහි ද දෙවියන් පිළිබඳ සඳහන් වේ. බුදුන් වහන්සේ දෙව් ලොවට වැඩ දෙවියන්ට ධර්මය දේශනා කළ බවත්, දෙවිවරුන් බුදුන් වහන්සේ හමුවට පැමිණ ඇතැම් ප්‍රශ්න විමසා නිරාකරණය කර ගත් බවත් සූත්‍ර දේශනාවල සඳහන් වී ඇත. ඒ අනුව දේව සංකල්පය අපේ ජන ආගමට එක් කර ගැනීමට බාධාවක් නො වී ය. එහෙයින් බුදු දහමේ එන ආමිසයට දේව සංකල්පය එක් වීම පහසු විය. හින්දු දහමේ එන විවිධ දේව සංකල්ප අප සමාජය තුළ

පැතිර ගියේ ඒ ආකාරයෙනි. එහෙත් සිංහල සමාජය තුළ එම දෙවිවරුන් අපේ ජන ආගමට එක් කර ගෙන ඇත්තේ බෞද්ධකරණය කර ගැනීමෙනි. එනම්, ඔවුන් ජනශ්‍රැති හරහා බුදුන් වහන්සේ සරණ ගිය අය බවට පත් කිරීමෙනි. නැතහොත් ඔවුන් මතු බුදු බව ප්‍රාර්ථනා කරන අය ලෙස දැක්වීමෙනි.

ශ්‍රී ලංකාවේ දේව වන්දනය ප්‍රචලිත වීමට තවත් හේතුවක් වී ඇත්තේ ඒ සඳහා රාජානුග්‍රහය ලැබීම යි. ලක්දිවට පත්තිනි ඇදහිල්ල ගෙන එන ලද්දේ ගජබා රජු විසිනි. ඒ අනුව ලක්දිව පත්තිනි ඇදහිල්ල ප්‍රචලිත වීමට එය ද බලපා ඇති බව පෙනේ. මේ සඳහා බලපාන ලද අනෙක් කාරණය වන්නේ හින්දු ආගම අදහන රජවරුන් බලයට පත් වීම යි. එවැනි අවස්ථාවල හින්දු විශ්වාස වේගයෙන් පැතිර ගිය බව දක්නට ලැබේ. මහනුවර යුගය වන විට පත්තිනි ඇදහිල්ලේ දක්නට ලබෙන ශීඝ්‍ර වර්ධනයට මෙය බලපා ඇති බව කිව හැකි ය.

දේව සංකල්පයෙහි විකාශනයේ වැදගත් අවස්ථාවක් ලෙස දේවතාවියන් පිදීමේ චාරිත්‍රය එක් වන බව දක්නට ලැබේ. පත්තිනි සහ කිරිඅම්මාවරුන් පිදීම ද එහි සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැකි ය. පතිව්‍රතා ධර්මයෙහි බලමහිමය ලොවට හෙළි කරමින් පත්තිනි ඇදහිල්ල දක්ෂිණ භාරතයේ ආරම්භ විය. එහෙත් ඊට පෙර ද අප රටේ දේවතාවියන් ලෙස සලකා අම්මාවරුන් පිදීමේ චාරිත්‍රය පැවති බවට තොරතුරු දක්නට ලැබේ. ලක්දිව වැදි ජනතාව අතර පවතින කිරිඅම්මාවරුන් පිදීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. ලක්දිව පත්තිනි ඇදහිල්ලේ ආරම්භය ගජබා රජු සමයේ සිදු වූ බව කියවේ. ඉන් පසුව එම ඇදහිල්ල අප රටේ පැවති කිරිඅම්මා පිදීම හා මිශ්‍ර වී පත්තිනි ඇදහිල්ල වඩාත් ප්‍රචලිත ඇදහිල්ලක් බවට පත් වූ ආකාරය හඳුනා ගත හැකි ය. දක්ෂිණ භාරතයේ වූ එක් පත්තිනි ලංකාවේ දී සත්පත්තිනි වන්නේ ඒ අනුව ය. ලංකාවේ පුද ලැබූ කිරිඅම්මාවරුන් සත්දෙනා සත්පත්තිනි වී ඇති ආකාරය ඉන් පැහැදිලි වේ. භාරතයේ වූ හින්දු පත්තිනි ලංකාවේ දී බෞද්ධකරණය වී වර්තමානය වන විට ලක්දිව ජනතාවගේ සශ්‍රීකත්වයේ දෙවඟන ලෙස පුද ලබන ආකාරය ද අවබෝධ කර ගැනීමට හැකි වේ. අප රටේ සශ්‍රීකත්වය සඳහා පැවැත්වෙන සියලු ම ශාන්තිකර්මවල දී පුද ලබන එක ම දෙවියා පත්තිනි දෙවඟන වීම මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

මෙම පර්යේෂණයේ දී පත්තිනි සහ කිරිඅම්මාවරුන් යනු කවුරුන් ද, පත්තිනි සහ කිරිඅම්මාවරුන් අතර පවතින සම්බන්ධය කෙබඳු ද, පත්තිනි සංකල්පය අප රටේ ව්‍යාප්ත වී ඇත්තේ කෙසේ ද යන්නත් විමසා බැලීමට හැකි විය. එසේ ම කිරිඅම්මා දානයේ චත්පිළිවෙත්වල ස්වභාවය පිළිබඳවත්, ප්‍රදේශීය වශයෙන් එම චත්පිළිවෙත්වල පවත්නා වෙනස්කම් පිළිබඳවත් අධ්‍යයනය කොට එහි ස්වභාවයන් තහවුරු කර ගැනීමට හැකි විය.

## දත්ත දායක නාම ලේඛනය

- කරුණාවතී, පී.ඩී. (2022.02.29), අවු. 72, නො. 50, මාමඩල, අම්බලන්තොට, (දේවාලයක් පවත්වාගෙන යන්නියකි).
- ගුණවතී, එම්. (2022.09.11), අවු. 71, බෙරිගාලගොඩ පාර, තණලන්ද, අම්බලන්තොට (යාතුකර්ම සිදු කරන්නියකි).
- චන්ද්‍රලතා, එස්.ඩබ්. (2022.02.01), අවු. 63, විජේසුන්දරාරාම පාර, කුඹල්ගම, මාතර, (ගෘහිණියකි).
- ලලිතා, කේ. එල්. (2022.08.30), අවු. 53, නො.26, සෙවණගල - උතුර, සෙවණගල, (ගෘහිණියකි).
- සීලවතී, පී.එම්. (2022.09.21), අවු. 64, නො.13, සෙවණගල, ඇඹිලිපිටිය, (ප්‍රධාන කිරිඅම්මා කෙනෙකි).

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආරියරත්න, සුනිල්, (1991), **දෙමළ සාහිත්‍ය ඉතිහාසය**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඇඳගම, පන්ඩුල, (සංස්.), (2003), **සබරගමු වංශ කතාව**, රත්නපුර: සබරගමු පළාත් සභාව

ඒකනායක, වසන්තා මැණිකේ, (1997), **ගලේ බණ්ඩාර දෙවියෝ**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කාරියවසම්, තිස්ස, (1990), **ගම්මඩු පුරාණය**, මරදාන - කොළඹ: සමයවර්ධන

කාරියවසම්, තිස්ස, (1998), **ශාන්තිකර්ම සහ සිංහල සමාජය**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කෝට්ටගොඩ, ජයසේන, (1997), **පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය**, කොළඹ - 11: දළුවත්ත ප්‍රින්ටර්ස්.

ගුණසේන, ඉන්ද්‍රා දේවිකා, (2020), **පත්තිනි පූජාව සහ ශාන්තිය**, නුගේගොඩ: මොඩන් පොත් සමාගම.

ජයවර්ධන, එස්. කේ. , (1985), **පැරණි ලංකාවේ ආගම් හා පුද පූජා**, කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධර්මදාස, කේ. එන්. ඕ. සහ තුන්දෙණිය එච්. එම්. එස්. (1994), **සිංහල දේව පුරාණය**, පාදුක්ක: රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව.

නිලන්ත කුමාර ධනසේකර, ඩී. ඇම්. (2015), **පත්තිනි මෑණියෝ සහ කිරිඅම්මා දානය**, ගණේමුල්ල: උදය ප්‍රකාශකයෝ.

පියතිලක හල්පෙ, එච්. එම්. (සම්.), (2019), **පත්තිනි දෙවියෝ සහ කිරිඅම්මාවරුන්ගේ දානය**, දන්කොටුව: වාසනා ප්‍රකාශකයෝ.

මීගස්කුඹුර, පී. බී. (1995), **සිරිලක වැදි ජන පුරාණය**, කෝට්ටේ: පිනිදිය ප්‍රකාශකයෝ.

මූර්ති, (1972) , **ආගම සහ මියගිය ලෝකය**, කොළඹ - 02: සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම

රත්නපාල, නන්දසේන, (1995), **ජනශ්‍රැති විද්‍යාව**, කොළඹ - 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නායක, සුදත්, (2013), **කිරිඅම්මලාගේ දානය**, කොළඹ - 11: සුසර ප්‍රකාශන.

විජයතුංග, හරිස්චන්ද්‍ර, (1982), **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය - I**, කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

විජයතුංග, හරිස්චන්ද්‍ර, (1984), **ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය** - II, කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

සරත්චන්ද්‍ර, එදිරිවීර, (1992), **සිංහල ගැමි නාටකය**, මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.

සුමනපාල සමරසේකර, ජේ. කේ. (1995) , **තොවිල්** , කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේකර සහ සමාගම.

සුරවීර, ඒ. වී.(සංස්.), (1976), **රාජාවලිය**, කොළඹ: සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම.

සුරියබණ්ඩාර, මිස්සක, (2018), **ශ්‍රී ලංකාවේ දේව පූජාවිධි හා ඒවායේ අර්ථ,** දංකොටුව: මල්පියලි ප්‍රකාශකයෝ.

සෝරත හිමි, වැලිවිටියේ, (බු.ව.2507), **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය** - I, ජේමසිරි අභයවික්‍රම, කොළඹ: අනුල මුද්‍රණාලය.

සෝරත හිමි, වැලිවිටියේ, (බු.ව.2513), **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය** - II, ගල්කිස්ස: අභය ප්‍රකාශකයෝ.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (සංස්.), (1963), **සිංහල විශ්වකෝෂය** - I, කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව